# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1987 අංක 30 දරන
# වෛද්‍ය (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1987 ජූනි මස 04 වන දින.]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1987 ජූනි මස 05 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය

මිල : රු. 2.70 යි. තැපැල් ගාස්තුව : රු. 2.30 යි

# 1987 අංක 30 දරන වෛද්‍ය (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1987 ජූනි මස 04 වන දින]

එල්. ඩී.—ඕ. 47/82.

## වෛද්‍ය ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1987 අංක 30 දරන වෛද්‍ය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) වෛද්‍ය ආඥාපනතේ 5 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 105 වන අධිකාරයේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ "ලංකා විශ්වවිද්‍යාලය" යන යෙදුම යෙදෙන කවර වූ හෝ ස්ථානයක, ඒ වචන වෙනුවට "1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත මගින් පිහිටුවනු ලැබූ හෝ පිහිටුවන ලදැයි සලකනු ලබන විශ්වවිද්‍යාලයක්" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) එහි (1) වන උපවගන්තියේ (අ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(අඅ) ශික්ෂණ රෝහල් අධ්‍යක්ෂ ජනරාල්වරයා වශයෙන් තත්කාලයේ කාර්ය ඉටු කරන තැනැත්තාගෙන් ද ;" සහ

(3) එහි (4) වන උපවගන්තියේ "ලංකාව" යන වචනය යෙදෙන කවර වූ හෝ ස්ථානයක, ඒ වචනය වෙනුවට "ශ්‍රී ලංකාව" යන වචන ආදේශ කිරීමෙන්.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය මෙයින් ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"විද්‍යාල සභාවේ රැස්වීම්වල කාර්ය පරිපාටිය.

6. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා විසින් හෝ ඔහු නොමැති විට, ශික්ෂණ රෝහල් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හෝ ඒ දෙදෙනාම නොමැති විට, නියෝජ්‍ය සෞඛ්‍ය අධ්‍යක්ෂවරයා (වෛද්‍ය සේවා) විසින් විද්‍යාල සභාවේ සෑම රැස්වීමකම සභාපතිවරයා වශයෙන් මුලසුන දැරිය යුතු ය.".

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ උපවගන්තියේ (ඇ) ඡේදයේ "ඖෂධවේදී භෛෂජ්‍යකයන් වශයෙන් වූ කාර්යක්ෂමතා සහතික පත්‍ර ද"; යන වචන වෙනුවට "ඖෂධවේදී භෛෂජ්‍යකයන් වශයෙන් වූ කාර්යක්ෂමතා හෝ ප්‍රවීණතා සහතික පත්‍ර ද;" යන වචන ආදේශ කිරීමෙන් ;

2—ඒ 094646—7,260 (86/12)

(2) ඒ උපවගන්තියේ (ඇ) ඡේදයේ "හෙදියන් වශයෙන් වූ කාර්යක්ෂමතා සහතික පත්‍රද" යන වචන වෙනුවට "හෙදියන් වශයෙන් වූ කාර්යක්ෂමතා සහතික පත්‍රය"; යන වචන ආදේශ කිරීමෙන් ;

(3) ඒ උපවගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේද ඇතුළත් කිරීමෙන් :—

"(ඉ) විකිරණ ශිල්පීන් වශයෙන් වූ ප්‍රවීණතා සහතික පත්‍ර ද ;

(ඊ) වෛද්‍ය රසායනාගාර කාර්මිකයන් වශයෙන් වූ ප්‍රවීණතා සහතික පත්‍ර ද ;

(උ) භෞත චිකිත්සකයින් වශයෙන් වූ ප්‍රවීණතා සහතික පත්‍ර ද ;

(ඌ) වෘත්තිය චිකිත්සකයින් වශයෙන් වූ ප්‍රවීණතා සහතික පත්‍ර ද ;

(එ) විද්‍යුත් චන්තුරේඛකයින් වශයෙන් වූ ප්‍රවීණතා සහතික පත්‍ර ද ;

(ඒ) ශ්‍රවණවේදඥයින් වශයෙන් වූ ප්‍රවීණතා සහතික පත්‍ර ද ;

(ඔ) සායනික භෞතවේදඥයින් වශයෙන් වූ ප්‍රවීණතා සහතික පත්‍ර ද ;

(ඕ) භාෂණ චිකිත්සකයින් වශයෙන් වූ ප්‍රවීණතා සහතික පත්‍ර ද ;

(ක) කරපාද චිකිත්සකයින් වශයෙන් වූ ප්‍රවීණතා සහතික පත්‍ර ද ;

(ග) ආහාරඥයින් වශයෙන් වූ ප්‍රවීණතා සහතික පත්‍ර ද ;

(ච) අක්ෂි පරීක්ෂක සහායකයින් වශයෙන් වූ ප්‍රවීණතා සහතික පත්‍ර ද ;

(ජ) විද්‍යුත් නිකර්පර ලේඛකයින් වශයෙන් වූ ප්‍රවීණතා සහතික පත්‍ර ද ;

(ට) පෝෂණඥයින් වශයෙන් වූ ප්‍රවීණතා සහතික පත්‍ර ද ;

(ඩ) සායනික මනෝවිද්‍යාඥයින් වශයෙන් වූ ප්‍රවීණතා සහතික පත්‍ර ද.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"වෛද්‍ය සභාවේ සංයුතිය හා කාර්ය.

12. (1) (මෙම ආඥාපනතේ "වෛද්‍ය සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා වෛද්‍ය සභාව පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය :—

(අ) අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන සභාපතිවරයා ;

(ආ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත මගින් පිහිටුවනු ලැබ හෝ පිහිටුවන ලදැයි සලකනු ලබන එක් එක් විශ්ව විද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පීඨයේ ආචාර්ය වරයකු විසින් තෝරා පත් කර ගනු ලබන එක් සාමාජිකයෙක් ;

(ඇ) 29 වන වගන්තිය යටතේ ලියා පදිංචි කරනු ලැබූ වෛද්‍ය වෘත්තිකයන් විසින් තෝරා පත් කර ගනු ලබන සාමාජිකයන් අට දෙනෙක් ;

(ඈ) 41 වන වගන්තිය යටතේ ලියාපදිංචි කරන ලද, වෛද්‍ය වෘත්තියෙහි යෙදීමට හිමි කම් ඇති තැනැත්තන් විසින් තෝරා පත් කර ගනු ලබන එක් සාමාජික යෙක් ;

(ඉ) 43 වන වගන්තිය යටතේ ලියා පදිංචි කරන ලද දන්ත වෛද්‍යවරුන් විසින් තෝරා පත් කර ගනු ලබන එක් සාමා ජිකයෙක් ;

(ඊ) යටත් පිරිසෙයින්, රජයේ සේවා නියුක්ති යෙහි නොයෙදෙන හෝ රජයෙන් විශ්‍රාම වැටුප් නොලබන සාමාජිකයන් දෙදෙනකු ඇතුළුව අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන සාමාජිකයන් හතර දෙනෙක් ;

(උ) සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා ;

(ඌ) ශික්ෂණ රෝහල් අධ්‍යක්ෂ ජනරාල් වරයා.” සහ

(2) එහි (3) වන උපවගන්තියේ “ලංකාවේ” යන වචනය වෙනුවට “ශ්‍රී ලංකාවේ” යන වචන ආදේශ කිරීමෙන්.”.

(3) එහි (3) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

“(4) මේ ආඥාපනත යටතේ ලියාපදිංචි කරන ලද යම් තැනැත්තකු, (1) වන උපවගන්තියේ (ඇ), (ඈ) හෝ (ඉ) යන ඡේදවල සඳහන් කරනු ලැබ ඇති තෝරා පත් කර ගැනීම සිදු කරනු ලබන අවස්ථාවේ දී ආඥාපනත යටතේ පවත්වා ගෙන යන ලේඛන අනුව ශ්‍රී ලංකාවේ වාසය නො කරන්නේ නම්, එම තෝරා පත් කර ගැනීමේදී ඡන්දය පාවිච්චි කිරීමට ඔහුට හිමිකම නොතිබිය යුතුය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය මෙයින් ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"වෛද්‍ය සභාවේ සාමාජිකයන් විය හැක්කේ වෛද්‍ය වෘත්තිකයන්ට බව.

13. වෛද්‍ය වෘත්තිකයකු හෝ වෛද්‍ය විද්‍යාව සහ ශල්‍ය වෛද්‍ය විද්‍යාව පිළිබඳ වෘත්තියෙහි යෙදීමට හිමිකම් ඇති තැනැත්තකු හෝ දන්ත වෛද්‍ය වරයකු හෝ නොවන කිසිම තැනැත්තකු වෛද්‍ය සභාවේ සාමාජිකයකු වීමට සුදුසුකම් නො ලබන්නේ ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය සංශෝධනය කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තියේ "වෛද්‍ය සභාවේ" යන වචන වෙනුවට "12 වන වගන්තියේ (උ) හා (ඌ) ඡේදවල සඳහන් සාමාජිකයන් හැර, වෛද්‍ය සභාවේ" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය සංශෝධනය කිරීම.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තියේ (ඇ) ඡේදයේ "ලංකාවෙන්" යන වචනය වෙනුවට "ශ්‍රී ලංකාවෙන්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය සංශෝධනය කිරීම.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(1) වෛද්‍ය සභාව විසින් වෛද්‍ය මණ්ඩලයේ ලේකම්වරයා වශයෙන් ද වෛද්‍ය සභාව විසින් භාණ්ඩාගාරික වශයෙන් වෙනත් තැනැත්තකු පත් කළහොත් මිස, භාණ්ඩාගාරිකවරයා වශයෙන් ද ක්‍රියා කළ යුතු රෙජිස්ට්‍රාර්වරයකු පත් කළ යුතු ය. තව ද, වෛද්‍ය මණ්ඩලය විසින් සහකාර රෙජිස්ට්‍රාර්වරයකු පත් කළ හැකි අතර මේ ආඥාපනත යටතේ තම කාර්ය ඉටු කිරීමේ දී රෙජිස්ට්‍රාර්වරයාට ඔහු විසින් සහාය දිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය සංශෝධනය කිරීම.

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (ඇ) ඡේදයේ "විගණනය කිරීම" යන වචන වෙනුවට "විගණනය කිරීම; සහ" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේද එකතු කිරීමෙන් :—

"(ඉ) විශ්වවිද්‍යාලවල හෝ මේ ආඥාපනත යටතේ ලියාපදිංචිවීම සඳහා යම් තැනැත්තකුට හිමිකම් ලැබෙන යම් සුදුසුකමක් ප්‍රදානය කරන හෝ පිරිනමන වෙනත් ආයතනවල අධ්‍යයන පාඨමාලා, විභාග, කාර්ය මණ්ඩලය, උපකරණ, ඉඩ පහසුකම්, පුහුණුව හා වෙනත් පහසුකම් සම්බන්ධයෙන් වූ තත්ත්වයන් ද ඇතුළුව, වෛද්‍ය විද්‍යා අධ්‍යාපනයේ අවම තත්ත්වයන් පවත්වාගෙන යාම ;

(ඊ) විශ්වවිද්‍යාලවල හා වෙනත් ආයතනවල පශ්චාත් උපාධි වෛද්‍ය විද්‍යා අධ්‍යාපනයේ අවම තත්ත්ව යන් පවත්වාගෙන යාම.''.

ප්‍රධාන ප්‍රඥප්තියේ IIIඅ වන අලුත් කොටස ඇතුළත් කිරීම.

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ III වන කොටසට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් කොටස මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ IIIඅ වන කොටස වශයෙන් බල පැවැත්විය යුතු ය :—

### IIIඅවන කොටස—වෛද්‍ය සභාවේ බලතල

පිළිගත් විශ්ව විද්‍යාල වලට හා ආයතනවලට ඇතුළ් වී පරීක්ෂණ පැවැත්වීමට වෛද්‍ය සභාව විසින් බලය දෙන ලද තැනැත්තන්ගේ බලය.

19අ. (1) වෛද්‍ය සභාව විසින් ලියවිල්ලකින් බලය දෙනු ලැබූ යම් තැනැත්තකු විසින්, ලියවිල්ල කින් සති දෙකකට නො අඩු දැන්වීමක් දීමෙන් පසුව, පිළිගත් විශ්වවිද්‍යාලයකට හෝ ආයතනය කට ඇතුළුවී—

(අ) ඒ විශ්වවිද්‍යාලය හෝ විද්‍යායතනය විසින් සම්පාදනය කරනු ලබන සහ වෛද්‍ය විද්‍යා සුදුසුකමක් ප්‍රදානය කිරීමට හෝ පිරිනැමීමට හේතු වන අධ්‍යයන පාඨ මාලා ;

(ආ) එවැනි යම් සුදුසුකමක් ප්‍රදානය කිරීමේ හෝ පිරිනැමීමේ කාර්යය සඳහා ඒ විශ්ව විද්‍යාලය හෝ ආයතනය විසින් පවත් වනු ලබන විභාග සම්බන්ධයෙන් නියම කර ඇති ප්‍රවීණතා මට්ටම ;

(ඇ) ඒ අධ්‍යයන පාඨමාලා සඳහා ඒ විශ්වවිද්‍යා ලය හෝ ආයතනය විසින් සපයනු ලැබ ඇති කාර්ය මණ්ඩලය, උපකරණ, නවා තැන් හා පහසුකම්

නියමිත තත්ත්වයන්ට අනුකූල වන්නේදැයි දැන ගැනීමේ කාර්යය සඳහා අවශ්‍ය වන යම් විභාග හෝ විමර්ශන ඒ විශ්වවිද්‍යාලය හෝ ආයතනය සම්බන්ධයෙන් පැවැත්වීම සහ අදාළ පීඨයේ සාමාජිකයන් සම්බන්ධයෙන් යම් පරීක්ෂණ පැවැත්වීම ද කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් සියලු විභාග, විමර්ශන හා පරීක්ෂණ පැවැත්වීමේ කාර් යය සඳහා ඒ උපවගන්තියේ සඳහන් තැනැත්තාට අවශ්‍ය වන සියලු පහසුකම්, පිළිගත් විශ්වවිද්‍යාල යක හෝ ආයතනයක උප කුලපතිවරයා හෝ ප්‍රධානියා විසින් සහ අදාළ පීඨයේ සාමාජිකයන් විසින් සැපයිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ වෛද්‍ය සභාව විසින් බලය දෙනු ලැබූ යම් තැනැත්තකු විසින් ඒ උපවගන්තියේ සඳහන් යම් විභාගයක් විමර්ශනයක් හෝ පරීක්ෂණයක් පවත්වනු ලබන අවස්ථාවක, ඔහු විසින් තම නිගමනයන් පිළිබඳ වාර්තාවක් සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ වෛද්‍ය සභාව විසින් බලය දෙනු ලැබුවා වූ සහ ඒ උප වගන්තිය මගින් ඒ තමා වෙත පිරිනමනු ලැබූ බලතල ක්‍රියාත්මක කරන්නා වූ සෑම තැනැත්තකු ම, දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව රජයේ සේවකයකු ලෙස සලකනු ලැබිය යුතු ය.

*තොරතුරු සපයන ලෙස පිළිගත් විශ්වවිද්‍යාලවලට සහ ආයතනවලට නියම කිරීමට වෛද්‍ය සභාවට ඇති බලය.*

19ආ. වෛද්‍ය මණ්ඩලය විසින්, ලියවිල්ලකින් වූ නියමයක් මගින්, 19අ වන වගන්තියේ (අ) ඡේදයේ සඳහන් කරුණු සම්බන්ධයෙන් සභාවට අවශ්‍ය වන යම් තොරතුරක් හෝ පැහැදිලි කිරීමක්, විධානයේ දැක්වෙන කාලය ඇතුළත මණ්ඩලය වෙත සපයන ලෙස පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ ආයතනයක උප කුලපතිවරයාට හෝ ප්‍රධානියාට විධාන කරනු ලැබිය හැකි අතර, අවස්ථාවෝචිත පරිදි, ඒ පිළිගත් විශ්වවිද්‍යාලයේ හෝ ආයතනයේ උප කුලපතිවරයා විසින් හෝ ප්‍රධානියා විසින් ඒ විධානය පිළිපැදිය යුතු ය.

*පිළිගත් විශ්වවිද්‍යාල හා ආයතන විසින් ප්‍රදානය කරන ලද සුදුසුකම් පිළිගැනීම අස් කර ගැනීම පිණිස නිර්දේශ කිරීම සඳහා වෛද්‍ය සභාවට ඇති බලය.*

19ඇ. (1) 19අ වන වගන්තියේ (3) වන උප වගන්තිය යටතේ වෛද්‍ය සභාව වෙත ඉදිරිපත් කරනු ලැබූ වාර්තාවක් අනුව හෝ 19ආ වන වගන්තිය යටතේ සපයන ලද යම් තොරතුරක් අනුව වෛද්‍ය විද්‍යා සුදුසුකමක් ප්‍රදානය කිරීමට හෝ පිරිනැමීමට හේතු වන පරිදි පිළිගත් විශ්වවිද්‍යාලයක් විසින් හෝ ආයතනයක් විසින් සලස්වනු ලැබූ අධ්‍යයන පාඨමාලා හෝ එවැනි යම් සුදුසුකමක් ප්‍රදානය කිරීම හෝ පිරිනැමීම සඳහා පවත්වනු ලැබූ යම් පරීක්ෂණයක දී ඒ විශ්වවිද්‍යාලය විසින් හෝ ආයතනය විසින් නියම කරනු ලැබූ ප්‍රවීණතා මට්ටම හෝ ඒ අධ්‍යයන පාඨමාලා පිළිබඳ කාර්යය සඳහා ඒ විශ්වවිද්‍යාලය විසින් හෝ ආයතනය විසින් සපයනු ලැබ ඇති කාර්ය මණ්ඩලය, ඉඩපහසුකම් හා උපකරණ නියමිත ප්‍රමිතීන්ට අනුකූල නොවන බවට වෛද්‍ය සභාව සෑහීමට පත්වූ අවස්ථාවක, ඒ සුදුසුකම මේ ආඥාපනත යටතේ ලියාපදිංචි කිරීමේ කාර්යය සඳහා නොපිළිගත යුතු යයි සභාව විසින් අමාත්‍යවරයා වෙත නිර්දේශ කළ හැකිය.

(2) පිළිගත් විශ්වවිද්‍යාලයක් හෝ ආයතනයක් සම්බන්ධයෙන් (1) වන උපවගන්තිය යටතේ නිර්දේශයක් ලැබුණු විට, අමාත්‍යවරයා විසින් ඒ නිර්දේශයේ පිටපතක් ඒ විශ්වවිද්‍යාලය හෝ ආයතනය වෙත යවා, නිශ්චිත කාලයක් ඇතුළත ඒ සම්බන්ධයෙන් තම අදහස් දක්වන ලෙස ඉල්ලා සිටිය යුතු ය.

(3) විශ්වවිද්‍යාලයක් විසින් හෝ ආයතනයක් විසින් (2) වන උපවගන්තිය යටතේ අදහස් දක් වන ලද්දේ නම්, ඒ අදහස් පරීක්ෂා කිරීමෙන් පසුව සහ අවශ්‍ය යයි තමා විසින් සලකනු ලබන වැඩිදුර විභාගයක් පැවැත්වීමෙන් පසුව—

(අ) වෛද්‍ය විද්‍යා සුදුසුකමක් ප්‍රදානය කිරීමට හෝ පිරිනැමීමට හේතු වන පරිදි ඒ විශ්වවිද්‍යාලය විසින් හෝ ආයතනය විසින් සලස්වනු ලැබූ අධ්‍යයන පාඨමාලා ;

(ආ) ඒ සුදුසුකම ප්‍රදානය කිරීම හෝ පිරිනැමීම සඳහා ඒ විශ්වවිද්‍යාලය හෝ ආයතනය විසින් පවත්වනු ලැබූ පරීක්ෂණවල දී දැක්විය යුතු නියමිත ප්‍රවීණතා මට්ටම ; හෝ

(ඇ) ඒ අධ්‍යයන පාඨමාලා සඳහා ඒ විශ්වවිද්‍යාලය හෝ ආයතනය විසින් සපයනු ලැබ ඇති කාර්ය මණ්ඩලය, උපකරණ, ඉඩ පහසුකම් හා පහසුකම්

නියමිත ප්‍රමිතීන්ට අනුකූල නොවන බවට අමාත්‍යවරයා සෑහීමට පත්වන අවස්ථාවක, ඔහු විසින් නියෝගයක් මගින්, ඒ සුදුසුකම දරන තැනැත්තාට මේ ආඥාපනත යටතේ ලියාපදිංචිවීමට හැකි කරන මේ ආඥාපනතේ යම් විධිවිධානයක් ඒ නියෝගයේ දැක්වෙන විශ්වවිද්‍යාලයක් හෝ ආයතනයක් සම්බන්ධයෙන් නැතහොත් එවැනි විශ්වවිද්‍යාලයකට අනුබද්ධ යම් ආයතනයක් සම් බන්ධයෙන් බලාත්මකව පැවතීම එහි දැක්වෙන යම් දිනයක දී සිට අවසන් විය යුතු යයි ප්‍රකාශයට පත් කළ යුතු ය.

පරීක්ෂණ.

19ඇ. (1) වෛද්‍ය සභාවේ කටයුතු පිළිබඳව සහ සභාව විසින් මේ ආඥාපනත යටතේ ස්වකීය කාර්ය ඉටු කිරීම පිළිබඳව පැමිණිල්ලක් ලැබුණු විට, අමාත්‍යවරයා විසින්, ඒ සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වන ලෙස යම් තැනැත්තකුට විධාන කළ හැකි ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් පරිදි එවැනි පරීක්ෂණයක් පවත්වනු ලබන අවස්ථාවක, වෛද්‍ය සභාවේ වැඩ හා කටයුතු පිළිබඳව තමා දන්නා යම් තොරතුරක් සපයන ලෙස තමා භාරයේ ඇති ලේඛන හෝ ලියවිලි ඉදිරිපත් කරන ලෙස වෛද්‍ය සභාවේ යම් සාමාජිකයකුගෙන් සහ වෛද්‍ය සභාවේ කාර්ය මණ්ඩලයේ යම් සාමාජිකයකුගෙන් පරීක්ෂණය පවත්වන තැනැත්තා විසින් ඉල්ලා සිටිනු ලද විට, එකී වෛද්‍ය සභාවේ සාමාජිකයා විසින් සහ කාර්ය මණ්ඩලයේ සාමාජිකයා විසින් එසේ කළ යුතු ය.

අර්ථ නිරූපණය.

19ඉ. මේ ආඥාපනතේ මේ කොටසේ—

“ පිළිගත් විශ්වවිද්‍යාලය හෝ ආයතනය ” යන්නෙන් වෛද්‍ය විද්‍යා සුදුසුකමක් ප්‍රදානය කරන හෝ පිරිනමන යම් විශ්වවිද්‍යාලයක් හෝ ආයතනයක් අදහස් වේ ;

“ වෛද්‍ය විද්‍යා සුදුසුකම ” යන්නෙන් මේ ආඥාපනත යටතේ ලියාපදිංචිවීමට සුදුසුකම දරන තැනැත්තාට හිමිකම ලැබෙන යම් සුදුසුකමක් අදහස් වේ. ’.

ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කිරීම.

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියෙහි—

(අ) (අ), (ආ) සහ (ඇ) ඡේදවල සඳහන් “ ලංකාවේ ” යන වචනය වෙනුවට “ ශ්‍රී ලංකාවේ ” යන වචන ඒ ඡේදවල ආදේශ කිරීමෙන් ;

(ආ) (ආ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේද එහි ඇතුළත් කිරීමෙන් :—

“ (ආආ) 41 වන වගන්තියේ (2) වන, (2අ) වන, (2ආ) වන සහ (2ඇ) වන උපවගන්ති යටතේ වෛද්‍ය විද්‍යාව හා ශල්‍ය වෛද්‍ය විද්‍යා පිළිබඳ වෘත්තියෙහි යෙදීමට හිමිකම ඇති තැනැත්තන් පිළිබඳ ලේඛනයක් ;

(ආආආ) 31 වන වගන්තිය යටතේ තාවකාලිකව ලියාපදිංචිවීමට හිමිකම් ඇති තැනැත්තන් පිළිබඳ ලේඛනයක් ; ”

(ඇ) (ඇ) ඡේදයේ සඳහන් “ ලංකාවේ ” යන වචනය වෙනුවට “ ශ්‍රී ලංකාවේ ” යන වචන ඒ ඡේදයේ ආදේශ කිරීමෙන් ;

(ඇ) (ඉ) ඡේදයේ සඳහන් “ ලංකාවේ ” යන වචනය වෙනුවට “ ශ්‍රී ලංකාවේ ” යන වචන ඒ ඡේදයේ ආදේශ කිරීමෙන් සහ ඒ ඡේදයේ අගට “ සහ ” යන වචනය එකතු කිරීමෙන් ; සහ

(ඉ) (ඉ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(ඊ) ශ්‍රී ලංකාවේ සහාය වෛද්‍ය සහකාරයන් වශයෙන් වෘත්තියේ යෙදීමට සුදුසුකම් ලත් තැනැත්තන් පිළිබඳ ලේඛනයක්.";

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(3) අමාත්‍යවරයාගේ නිර්දේශය මත ජනාධිපතිවරයාගේ අනුමතය ඇතිව මිස, ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන තැනැත්තකු ලියාපදිංචි කරනු නොලැබිය යුතු ය.";

(3) ඒ වගන්තියේ (5අ) වන උප වගන්තියේ "ලංකාව" යන වචනය වෙනුවට "ශ්‍රී ලංකාව" යන වචනය එහි ආදේශ කිරීමෙන් ; සහ

(4) ඒ වගන්තියේ (8) වන උපවගන්තිය ඉවත් කිරීමෙන්.

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 26අ වන වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :— ප්‍රධාන ප්‍රඥප්තියේ 26අ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

"ලියාපදිංචි කිරීම අලුත් කිරීම.

26අ. (1) මේ ආඥාපනත යටතේ ලියාපදිංචි වූ තැනැත්තන් විසින් නියමිත කාලාන්තරයන්හි දී සහ නියමිත ගාස්තුව ගෙවා තම ලියාපදිංචි කිරීම අලුත් කරගත යුතු බව අමාත්‍යවරයා විසින් නියම කළ හැකි ය.

(2) මේ ආඥාපනත යටතේ ලියාපදිංචි වූ විවිධ වර්ගවලට අයත් තැනැත්තන් සම්බන්ධයෙන් විවිධ කාලාන්තරයන් හා විවිධ ගාස්තු නියම කරනු ලැබිය හැකි ය.

(3) යම් තැනැත්තකු තමා අයත් වන වර්ගය සඳහා නියමිත කාල සීමාව ඉකුත් වීමට පෙර තම ලියාපදිංචි කිරීම අලුත් කර ගැනීමට අපොහොසත් වුවහොත්, වෛද්‍ය සභාව විසින් ඒ තැනැත්තාගේ නම අදාළ ලේඛනයෙන් මකා දැමිය හැකි ය.

(4) (3) වන උපවගන්තිය යටතේ ලේඛනයකින් නම මකා දමනු ලැබූ යම් තැනැත්තකු පළමුවෙන් ඒ ලේඛනයේ ලියාපදිංචි කරනු ලැබුවේ යම් සුදුසුකමක් මත ද, ඒ සුදුසුකම ඔහු දිගටම දරන්නේ නම්, නියමිත ගාස්තුව ගෙවන ලද විට, ඔහුට ඒ ලේඛනයේ තම නම පුනස්ථාපනය කර ගැනීම සඳහා හිමිකම ඇත්තේ ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය සංශෝධනය කිරීම.

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තියේ (1), (2) සහ (2අ) වන උපවගන්ති ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

" (1) යම් තැනැත්තකු—

(අ) මනා චරිතයකින් යුක්ත වන්නේ නම්; සහ

(ආ) (i) ලංකා විශ්වවිද්‍යාලයේ හෝ අනුරූපී විශ්වවිද්‍යාලයක වෛද්‍ය විද්‍යාවේදී උපාධියක් සහ 32 වන වගන්තිය යටතේ වෛද්‍ය සභාව විසින් ප්‍රදානය කරනු ලැබූ සහතික පත්‍රයක් දරන්නේ නම්; හෝ

(ii) (i) අනුඡේදය යටතේ ලියාපදිංචි කරනු ලැබීමට සුදුසුකම් ලබා නොමැතිව—

(අඅ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන්නේ නම්:

(ආආ) ශ්‍රී ලංකාව හැර වෙනත් යම් රටක යම් විශ්ව විද්‍යාලයක හෝ වෛද්‍ය විද්‍යාලයක වෛද්‍ය විද්‍යා අධ්‍යාපනයේ මට්ටම කෙරෙහි සැලකිල්ල ඇතිව, මේ වගන්තියේ කාර්ය සඳහා වෛද්‍ය සභාව විසින් පිළිගනු ලැබූ ඒ විශ්වවිද්‍යාලයේ හෝ වෛද්‍ය විද්‍යාලයේ වෛද්‍ය විද්‍යාවේදී උපාධිය හෝ ඊට සමාන සුදුසුකම් දරන්නේ නම්;

(ඇඇ) වෛද්‍ය සභාව විසින් ඒ සඳහා නියමිත කරනු ලැබ ඇති විශේෂ පරීක්ෂණයෙන් සමත් වී තිබේ නම්; සහ

(ඈඈ) 32 වන වගන්තිය යටතේ වෛද්‍ය සභාව විසින් ප්‍රදානය කරනු ලැබූ සහතිකයක් දරන්නේ නම්

තමා වෛද්‍ය වෘත්තිකයකු ලෙස ලියාපදිංචි කරනු ලැබීම සඳහා වෛද්‍ය මණ්ඩලය වෙත ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කරනු ලැබූ විට, ඔහු එසේ වෛද්‍ය වෘත්තිකයකු ලෙස ලියා පදිංචි කරනු ලැබිය යුතු ය.

(2) 32 වන වගන්තිය යටතේ වෛද්‍ය සභාවෙන් සහතික පත්‍රයක් ලබා ගැනීම පිණිස අවශ්‍ය යම් පළපුරුදුකම් අත්කර ගැනීමට හැකි වීමේ කාර්ය සඳහා පමණක්, යම් තැනැත්තකු—

(අ) මනා චරිතයකින් යුක්ත වන්නේ නම්; සහ

(ආ) (i) ලංකා විශ්වවිද්‍යාලයේ හෝ අනුරූපී විශ්වවිද්‍යාලයක වෛද්‍ය විද්‍යාවේදී උපාධිය දරන්නේ නම්; හෝ

(ii) ලංකා විශ්වවිද්‍යාලයේ හෝ අනුරූපී විශ්වවිද්‍යාලයක වෛද්‍ය විද්‍යාවේදී උපාධිය ලබා ගැනීම සඳහා අවශ්‍ය පරීක්ෂණයෙන් සමත් වී තිබෙන නමුත්, ඒ උපාධිය ඔහු වෙත පිරිනැමීමෙහි ලා ඒ විශ්වවිද්‍යාලයේ ප්‍රමාදයක් හේතුකොට ගෙන ඔහු ඒ උපාධිය ලබාගෙන නොමැති නම්; හෝ

(iii) ඉහතින් වූ අනුඡේදයන් අතුරින් යම් අනුඡේදයක් යටතේ ලියාපදිංචි කරනු ලැබීමට සුදුසුකම් ලබා නොමැතිව—

(අඅ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන්නේ නම්; සහ

(ආආ) (i) ශ්‍රී ලංකාවේ හැර වෙනත් යම් රටක යම් විශ්ව විද්‍යාලයක හෝ වෛද්‍ය විද්‍යාලයක වෛද්‍ය විද්‍යා අධ්‍යාපනයේ මට්ටම කෙරෙහි සැලකිල්ල ඇතිව, මේ වගන්තියේ කාර්ය සඳහා වෛද්‍ය සභාව විසින් පිළිගනු ලැබූ, ඒ විශ්ව විද්‍යාලයේ හෝ වෛද්‍ය විද්‍යාලයේ වෛද්‍ය විද්‍යාවේදී උපාධිය හෝ ඊට සමාන සුදුසුකමක් දරන්නේ නම්; හෝ

(ii) ශ්‍රී ලංකාවේ හැර වෙනත් යම් රටක විශ්ව විද්‍යාලයක හෝ වෛද්‍ය විද්‍යාලයක වෛද්‍ය විද්‍යා අධ්‍යාපනයේ මට්ටම කෙරෙහි සැලකිල්ල ඇතිව මේ වගන්තියේ කාර්ය සඳහා වෛද්‍ය සභාව විසින් පිළිගනු ලැබූ, ඒ විශ්වවිද්‍යාලයේ හෝ වෛද්‍ය විද්‍යාලයේ වෛද්‍ය විද්‍යාවේදී උපාධිය හෝ ඊට සමාන සුදුසුකමක් ලබා ගැනීම පිණිස අවශ්‍ය පරීක්ෂණ වලින් සමත් වී තිබෙන නමුත්, ඒ උපාධිය ලබා ගැනීම සඳහා අවශ්‍ය අන්තර් ශිෂ්‍යත්ව කාලය ඔහු විසින් සම්පූර්ණ කර නොතිබීම හේතුකොට ගෙන, ඔහු ඒ උපාධිය ලබාගෙන නොමැති නම් සහ, ඒ අන්තර් ශිෂ්‍යත්ව කාලය ශ්‍රී ලංකාවෙහි සම්පූර්ණ කිරීමට සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා ඔහුට අවසර දී තිබේ නම්; සහ

(ඇඇ) වෛද්‍ය සභාව විසින් ඒ සඳහා නියමිත කරනු ලැබ ඇති විශේෂ පරීක්ෂණයෙන් සමත් වී තිබේ නම්

තමා වෛද්‍ය වෘත්තිකයකු ලෙස තාවකාලිකව ලියාපදිංචි කරනු ලැබීම සඳහා වෛද්‍ය මණ්ඩලය වෙත ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කරනු ලැබූ විට, ඔහු එසේ වෛද්‍ය වෘත්තිකයකු වශයෙන් තාවකාලිකව ලියාපදිංචි කරනු ලැබිය යුතුය.".

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය ඉවත් කිරීම.

**16.** ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය මෙයින් ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"ආණ්ඩුව විසින් සේවා නියුක්ති කරනු ලබන ඇතැම් වෛද්‍යවරයන් තාවකාලිකව ලියාපදිංචි කිරීම.

31. 29(1) වන වගන්තිය යටතේ ලියාපදිංචි කිරීම සඳහා සුදුසුකම් නොලැබූ යම් තැනැත්තකු විසින් තමා වෛද්‍ය නිලධරයකු වශයෙන් ආණ්ඩුවේ සේවා නියුක්තව සිටින බවට සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයාගෙන් ලබාගත් සහතිකයක් ඉදිරිපත් කරනු ලැබූ විට සහ රුපියල් පන්සියයක ගාස්තුවක් ගෙවනු ලැබූ විට රෙජිස්ට්‍රාර්වරයා විසින් ආණ්ඩුව යටතේ වූ තමාගේ සේවා නියුක්ති කාල

සීමාව සඳහා වෛද්‍ය වෘත්තිකයකු වශයෙන් තාවකාලිකව ලියාපදිංචි කරනු ලැබීමට ඒ තැනැත්තා හිමිකම ලබන්නේය. මේ වගන්තිය යටතේ ලියාපදිංචි කරන ලද තැනැත්තන්ගේ නම් වෙනම ලේඛනයක ඇතුළත් කරනු ලැබිය යුතු අතර, ආඥාව යටතේ වූ ඔහුගේ සේවානියුක්ති කාල සීමාව ඉකුත් වූ විට ඒවා ලේඛනයෙන් මකා දැමිය යුතුය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**17.** ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත්කොට, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

" අනුමත ආරෝග්‍යශාලාවල හෝ ආයතනවල පළපුරුද්ද පිළිබඳ සහතික පත්‍රය.

32. (1) වෛද්‍ය වෘත්තිකයෙකු ලෙස තාවකාලිකව ලියාපදිංචි කරනු ලැබූ තැනැත්තකු විසින් මේ වගන්තිය යටතේ සහතික පත්‍රයක් සඳහා වෛද්‍ය සභාවට ඉල්ලුම් කරනු ලැබූ සහ—

(අ) ඔහු අනුමත ආරෝග්‍යශාලා හෝ ආයතන එකක හෝ ඊට වැඩි ගණනක, නියමිත කාල සීමාවක් නේවාසික වෛද්‍ය නිලයක සේවානියුක්තියෙහි නිරතව සිටි බවට;

(ආ) ඔහු මේ උපවගන්තියේ (අ) ඡේදයේ සඳහන් පරිදි, අනුමත කාලසීමාවක් වෛද්‍ය විද්‍යාව පිළිබඳ වෘත්තියෙහිද, අනුමත කාලසීමාවක් ශල්‍ය වෛද්‍ය විද්‍යාව පිළිබඳ වෘත්තියෙහි ද අනුමත කාල සීමාවක් වෙනත් අනුමත ක්ෂේත්‍රයන් පිළිබඳ වෘත්තියෙහි ද නිරතව සිටි බවට; සහ

(ඇ) ඔහු එසේ සේවානියුක්තියේ යෙදී සිටිය දී සතුටුදායක සේවයක් ඉටු කර ඇති බවට

ඒ සභාව සෑහීමට පත්වූ අවස්ථාවක, ඒ සභාව, එසේ සෑහීමට පත්වූ බවට නියමිත ආකෘතියෙහි සහතික පත්‍රයක් ඒ සභාව විසින් ප්‍රදානය කළ යුතු ය.

මේ වගන්තියේ කාර්ය සඳහා—

" අනුමත ආරෝග්‍යශාලාව හෝ ආයතනය " යන්නෙන් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා සහ ශික්ෂණ රෝහල් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඉදිරිපත් කරනු ලැබුවා වූ ආරෝග්‍යශාලා සහ ආයතන ලැයිස්තු අතුරින් වෛද්‍ය සභාව විසින් අනුමත කරනු ලැබූ ආරෝග්‍යශාලාවක් හෝ ආයතනයක් අදහස් වේ.

"අනුමත කාල සීමාව" යන්න වෛද්‍ය විද්‍යාව හෝ ශල්‍ය වෛද්‍ය විද්‍යාව පිළිබඳ හෝ වෙනත් අනුමත ක්ෂේත්‍රයක් පිළිබඳ වෘත්තිය සම්බන්ධයෙන් යෙදෙන විට, රටේ වෛද්‍ය අවශ්‍යතාවන් කෙරෙහි සැලකිල්ල ඇතිව වෛද්‍ය සභාව විසින් අනුමත කරනු ලැබූ කාලසීමාවක් ඉන් අදහස් වේ.

(2) ඒ වගන්තියේ (5) වන උපවගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන උපවගන්තිය එකතු කිරීමෙන් :—

" (6) 29 වන වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් වන උපාධිය දරන්නා වූ ද, නියමිත කාලසීමාව තුළ ශ්‍රී ලංකාව ඇතුළත හෝ ශ්‍රී ලංකාවෙන් පිටත වූ ආරෝග්‍යශාලා හෝ ආයතන එකක හෝ ඊට වැඩි ගණනක නේවාසික වෛද්‍ය නිලයක සේවා නියුක්තියෙහි යෙදී ඇත්තාවූ ද යම් තැනැත්තකු වෛද්‍ය වෘත්තියකු ලෙස තාවකාලිකව ලියාපදිංචි වී නොමැති වුව ද ඒ තැනැත්තාගේ සේවානියුක්තිය තුළ දී, මේ වගන්තියෙන් නියම කර ඇති පරිදි වෛද්‍ය විද්‍යාව, ශල්‍ය වෛද්‍ය විද්‍යාව හෝ ප්‍රසව වෛද්‍ය පිළිබඳ වෘත්තියෙහි නියුක්තව සිටි බවට වෛද්‍ය සභාව සෑහීමට පත් වුවහොත්, සභාව විසින් ඒ තැනැත්තාට මේ පනත යටතේ සහතික පත්‍රයක් ප්‍රදානය කළ හැකි ය.".

18. ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එහි (අ) ඡේදය අත් හැරීමෙන් ; සහ

(2) එහි (ආ) ඡේදය අත්හැර, ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ආ) වෛද්‍ය වෘත්තිකයකු ලෙස ඔහු ලියා පදිංචි කරනු ලැබුවේ යම් අභිඥාන පත්‍රයක්, උපාධියක් හෝ සහතික පත්‍රයක් මත ද, ඒ අභිඥාන පත්‍රය, උපාධිය හෝ සහතික පත්‍රය ඔහුට අහිමි කරනු ලැබිණි නම් ; ".

19. ප්‍රධාන ප්‍රඥප්තියේ 35 වන වගන්තියේ, "ලංකාවෙහිදී" යන වචනය වෙනුවට "ශ්‍රී ලංකාවෙහි" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 35 වන වගන්තිය සංශෝධනය කිරීම.

ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වන වගන්තිය සංශෝධනය කිරීම.

20. ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එහි (1) වන උපවගන්තියේ—

(අ) (ඈ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන් :—

"(ඉ) වෛද්‍ය විද්‍යාව හා ශල්‍ය වෛද්‍ය විද්‍යාව පිළිබඳ වෘත්තියෙහි යෙදීමට හිමිකම් ඇති තැනැත්තකු ලෙස මේ වගන්තියේ (2ඇ) වන උපවගන්තිය යටතේ ලියාපදිංචි කරනු ලැබ ඇත්තා වූද, ඒ උපවගන්තිය යටතේ පවත්වාගෙන යනු ලබන ලේඛනයෙහි තම නම තත් කාලයේ ඇතුළත්ව ඇත්තා වූ ද යම් වතු ඖෂධ සංයෝජකයෙක්.";

(2) (2ආ) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(2ඇ) වත්තක හෝ වතු සමූහයක සේවානියුක්තියේ යෙදී සිටින නැතහොත් එකී සේවානියුක්තිය අවසන් වී තිබෙන යම් වතු ඖෂධ සංයෝජකයකු විසින්—

(i) (අ) වතු ඖෂධ සංයෝජකයකු වූ තමා, වතු ඖෂධ සංයෝජකයකු වශයෙන්, යටත් පිරිසෙයින් සම්පූර්ණයෙන් අවුරුදු විස්සක් වූ කාලසීමාවක් තුළ කාර්යක්ෂම හා සතුටුදායක සේවයක් කර ඇති බවට ; හෝ

(ආ) ඖෂධ සංයෝජකයකු වූ තමා, වත්තක හෝ වතු සමූහයක සහ රජයේ සේවයේ ඖෂධ සංයෝජකයකු වශයෙන්, යටත් පිරිසෙයින්, සම්පූර්ණයෙන් අවුරුදු විස්සක් වූ කාල සීමාවක් තුළ කාර්යක්ෂම හා සතුටුදායක සේවයක් කර ඇති බවට ; සහ

(ii) තමා, ඒ කාලසීමාව තුළ, සම්පූර්ණයෙන් අවුරුදු දෙකක් වූ කාලසීමාවක් වෛද්‍ය වෘත්තිකයන් එක් අයකු හෝ ඊට වැඩි ගණනක් යටතේ ආරෝග්‍යශාලා එකක හෝ ඊට වැඩි ගණනක සේවය කර ඇති බවට ; සහ

(iii) තමා පුහුණුවීම සඳහා නියමිත කාලයක් පුහුණුවක් ලබා ඇති බවට

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා සෑහීමට පත්වන ලෙස සාධක ඉදිරිපත් කරන ලද විට සහ නියමිත ගාස්තුව ගෙවන ලද විට, වෛද්‍ය විද්‍යාව හා ශල්‍ය වෛද්‍ය විද්‍යාව පිළිබඳ වෘත්තියෙහි යෙදීමට හිමිකම් ලැබෙන පරිදි, රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ වතු ඖෂධ සංයෝජකයා ලියා පදිංචි කළ හැකි ය.

මේ උපවගන්තිය යටතේ ලියාපදිංචි කළ තැනැත්තන්ගේ ලේඛනයක් රෙජිස්ට්‍රාර්වරයා විසින් පවත්වා ගෙන යා යුතු අතර, මේ වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ මහා දමනු ලැබිය යුතු බවට වෛද්‍ය සභාව විසින් නියම කරන ලද යම් තැනැත්තකුගේ නම ඉන් මකා ඇමිය යුතු ය. ".

(3) ඒ වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(3) එසේ වුව ද (1) (අ) වන උපවගන්තිය යටතේ හෝ (1) (ඇ) වන උපවගන්තිය යටතේ හෝ (1) (ඇඇ) වන උපවගන්තිය යටතේ හෝ (1) (ඇඇඇ) වන උපවගන්තිය යටතේ වෛද්‍ය විද්‍යාව සහ ශල්‍ය වෛද්‍ය විද්‍යාව පිළිබඳ වෘත්තියෙහි යෙදීමට හිමිකම් ඇති ඇපොතිකරිවරයකු වූ යම් තැනැත්තකු හෝ (1) (ඇඇ) වන උපවගන්තිය යටතේ වෛද්‍ය විද්‍යාව සහ ශල්‍ය වෛද්‍ය විද්‍යාව පිළිබඳ වෘත්තියෙහි යෙදීමට හිමිකම් ඇති යම් වතු ඇපොතිකරිවරයකු වූ යම් තැනැත්තකු හෝ (1) (ඉ) වන උපවගන්තිය යටතේ වෛද්‍ය විද්‍යාව සහ ශල්‍ය වෛද්‍ය විද්‍යාව පිළිබඳ වෘත්තියෙහි යෙදීමට හිමිකම් ඇති යම් වතු ඖෂධ සංයෝජකයකු වූ යම් තැනැත්තකු රෝගියකුට ප්‍රතිකාර කිරීමේ දී අකාර්යක්ෂමතාව හෝ නොසැලකිල්ල දැක්වීමෙන් වරදක් කර ඇති බවට හෝ වෛද්‍ය විද්‍යාව සහ ශල්‍ය වෛද්‍ය විද්‍යාව පිළිබඳ වෘත්තියෙහි යෙදීමට ඔහු නුසුදුසු බව දක්වන හැසිරීමෙන් වරදක් කර ඇති බවට වෛද්‍ය සභාව සෑහීමට පත්වන ලෙස කරුණු ඉදිරිපත් කර ඇති අවස්ථාවක, මේ වගන්තිය මගින් ඔහු වෙත පිරිනමන ලද, ඔහු භුක්ති විඳින වරප්‍රසාද හා මුක්තීන් ස්ථිර වශයෙන්ම වෛද්‍ය සභාවේ නියමයක් හෝ නිශ්චිතව දැක්වෙන කාලසීමාව තුළ අත්හිටුවන බවට එසේ වෛද්‍ය සභාව විසින් නියමයක් කළ හැකි අතර අවස්ථානුගත කරුණු අනුව, අවස්ථෝචිත පරිදි, (2) වන උපවගන්තිය හෝ (2අ) වන උපවගන්තිය හෝ (2ආ) වන උපවගන්තිය යටතේ පවත්වා ගෙන යනු ලබන ඇපොතිකරිවරුන් පිළිබඳ ලේඛනයෙන් යම් තැනැත්තකුගේ නම මකා ඇමිය යුතු වන හෝ (2ඇ) වන උපවගන්තිය යටතේ පවත්වා ගෙන යනු ලබන වතු ඖෂධ සංයෝජකයන් පිළිබඳ ලේඛනයෙන් යම් තැනැත්තකුගේ නම මකා ඇමිය යුතු වන අවස්ථාවක, වෛද්‍ය සභාව විසින් එසේ නම මකා දැමිය යුතු බවට නියමයක් කළ හැකි ය."

ප්‍රධාන ප්‍රඥප්තියේ 43 වන වගන්තිය සංශෝධනය කිරීම.

21. ප්‍රධාන ප්‍රඥප්තියේ 43 වන වගන්තිය මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

" (1) යම් තැනැත්තකු, මනා චරිතයකින් යුක්ත වන්නේ නම් මිස සහ ලංකා විශ්වවිද්‍යාලය හෝ අනුරූප විශ්වවිද්‍යාලයක් විසින් පිරිනමනු ලැබූ හෝ ප්‍රදානය කරනු ලැබූ දන්ත වෛද්‍ය විද්‍යාව පිළිබඳ උපාධියක් හෝ අභිධාන පත්‍රයක් දරන්නේ නම් මිස, දන්ත වෛද්‍යවරයකු වශයෙන් ලියාපදිංචි නොකළ යුතු ය. " ;

(2) ඒ වගන්තියේ (1අ) වන උපවගන්තිය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

" (1අ) (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වී තිබුණ ද, ඒ උපවගන්තිය යටතේ දන්ත වෛද්‍යවරයකු වශයෙන් ලියාපදිංචි කිරීම සඳහා සුදුසු කම් නොලැබූ තැනැත්තකු—

(අ) පුරවැසිභාවයට අදාළව තත් කාලයේ බලාත්මක වන නීතියට අනුව ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන්නේ නම් ; සහ

(ආ) මේ උපවගන්තියේ කාර්යය සඳහා වෛද්‍ය සභාව විසින් පිළිගනු ලැබුවා වූ, ශ්‍රී ලංකාව හැර වෙනත් යම් රටක යම් විශ්වවිද්‍යාලයක හෝ වෛද්‍ය විද්‍යාලයක දන්ත වෛද්‍ය විද්‍යාව හෝ මුඛ ප්‍රදාහත විද්‍යාව පිළිබඳ උපාධියක් හෝ ඊට සමාන සුදුසුකමක් දරන්නේ නම් ; සහ

(ඇ) වෛද්‍ය සභාව විසින් තත් කාර්ය සඳහා නියමිත කරනු ලැබූ විශේෂ පරීක්ෂණයකින් සමත් වී තිබේ නම්

ඔහු දන්ත වෛද්‍යවරයකු වශයෙන් ලියාපදිංචි කරනු ලැබිය හැකි ය. " .

ප්‍රධාන ප්‍රඥප්තියේ 44 වන වගන්තිය ඉවත් කිරීම.

22. ප්‍රධාන ප්‍රඥප්තියේ 44 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 45 වන වගන්තිය සංශෝධනය කිරීම.

23. ප්‍රධාන ප්‍රඥප්තියේ 45 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එහි (අ) ඡේදය අත්හැරීමෙන් ; සහ

(2) එහි (ආ) ඡේදය අත් හැර, ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ආ) ඔහු දන්ත වෛද්‍යවරයකු වශයෙන් ලියාපදිංචි කරනු ලැබුවේ යම් අභිඥාන පත්‍රයක්, උපාධියක් හෝ සහතික පත්‍රයක් මත ද, ඒ අභිඥාන පත්‍රය, උපාධිය හෝ සහතික පත්‍රය ඔහුට අහිමි කරනු ලැබුවේ නම් ; " .

24. ප්‍රධාන ප්‍රඥප්තියේ 47 වන වගන්තිය, "ලංකාවේහිදී" යන වචනය වෙනුවට "ශ්‍රී ලංකාවේ" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 47 වන වගන්තිය සංශෝධනය කිරීම.

25. ප්‍රධාන ප්‍රඥප්තියේ 49 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 49 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එහි (3) වන වගන්තියේ (ඇ) ඡේදයේ "ලංකාණ්ඩුවේ" යන වචනය වෙනුවට "ශ්‍රී ලංකාණ්ඩුවේ" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (4) වන උපවගන්තිය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

'(4) (අ) දන්ත වෛද්‍යවරයකුට (ආ) ඡේදයට යටත්ව "වෛද්‍යවරයා" යන අභිධානය ආරූඪ කර ගැනීමට හෝ භාවිතා කිරීමට හිමිකම් ඇත්තේ ය :

එසේ වුව ද, ඒ අභිධානය භාවිතා කරන සෑම දන්ත වෛද්‍යවරයකු විසින්ම තම නමට පසුව "දන්ත ශල්‍ය වෛද්‍ය" යන වචන භාවිතා කළ යුතු ය.

(ආ) දන්ත වෛද්‍යවරයකු විසින්, 43 (1) වන වගන්තියේ දක්වා ඇති සුදුසුකම් තමා සතුව තිබීනම් මිස, දන්ත ශල්‍ය වෛද්‍ය හෝ ශල්‍ය දන්ත වෛද්‍ය යන අභිධානය ආරූඪ කර ගැනීම හෝ භාවිතා කිරීම නොකළ යුතු ය.'

26. ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එහි (අ) ඡේදය අත් හැරීමෙන් ; සහ

(2) එහි (ආ), (ඇ) හා (ඈ) ඡේද පිළිවෙලින් එහි (අ), (ආ) හා (ඇ) ඡේද වශයෙන් ප්‍රතනක්ෂර කිරීමෙන්.

27. ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තිය, (අ) ඡේදය අත් හැරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තිය සංශෝධනය කිරීම.

ප්‍රධාන ප්‍රඥප්තියේ 56 වන වගන්තිය සංශෝධනය කිරීම.

28. ප්‍රධාන ප්‍රඥප්තියේ 56 වන වගන්තියේ (1) උපවගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(ඇඇ) ශ්‍රී ලංකාවෙන් බැහැර ආයතනයක භෛෂජ්‍යය පිළිබඳ පුහුණුවීමේ හා අධ්‍යාපනයේ මට්ටම කෙරෙහි සැලකිල්ල ඇතිව විද්‍යාල සභාව විසින් මේ ඡේදයේ කාර්ය සඳහා අනුමත කරන ලද සහ ඒ ආයතනය විසින් ප්‍රදානය කරනු ලැබූ භෛෂජ්‍යය පිළිබඳ සුදුසුකමක් දරන්නේ නම් සහ ඉන් පසුව විද්‍යාල සභාව විසින් තත් කාර්යය සඳහා පවත්වනු ලබන විශේෂ පරීක්ෂණයකින් සමත් වී ඇති නම්;".

ප්‍රධාන ප්‍රඥප්තියේ VIIIඅ වන අලුත් කොටස ඇතුළත් කිරීම.

29. ප්‍රධාන ප්‍රඥප්තියේ VIII වන කොටසට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් කොටස මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ VIIIඅ වන කොටස වශයෙන් බලපැවැත්විය යුතු ය:—

"VIIIඅ වන කොටස

සහාය වෛද්‍ය සහායකයින්

සහාය වෛද්‍ය සහායකයින්ගේ ලේඛනය වෙන් වූ කොටස් වශයෙන් තිබිය යුතු බව.

60අ. (1) 20 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඊ) ඡේදය යටතේ පවත්වාගෙන යනු ලබන සහාය වෛද්‍ය සහකාරයන් පිළිබඳ ලේඛනය පහත දැක්වෙන පරිදි වෙන් වූ කොටස්වලට බෙදිය යුතු ය:—

(අ) විකිරණ ශිල්පීන් වශයෙන් ලේඛනයට ඇතුළත් කරනු ලැබූ සියලු තැනැත්තන්ගේ නම් "අ" කොටසෙහි අඩංගු විය යුතු ය;

(ආ) වෛද්‍ය රසායනාගාර කාර්මිකයින් වශයෙන් ලේඛනයට ඇතුළත් කරනු ලැබූ සියලු තැනැත්තන්ගේ නම් "ආ" කොටසෙහි අඩංගු විය යුතු ය;

(ඇ) භෞතචිකිත්සකයින් වශයෙන් ලේඛනයට ඇතුළත් කරනු ලැබූ සියලු තැනැත්තන්ගේ නම් "ඇ" කොටසෙහි අඩංගු විය යුතු ය;

(ඈ) වෘත්තීය චිකිත්සකයින් වශයෙන් ලේඛනයට ඇතුළත් කරනු ලැබූ සියලු තැනැත්තන්ගේ නම් "ඈ" කොටසෙහි අඩංගු විය යුතු ය;

(ඉ) විද්‍යුත් මස්තිෂ්කලේඛකයින් වශයෙන් ලේඛනයට ඇතුළත් කරනු ලැබූ සියලු තැනැත්තන්ගේ නම් "ඉ" කොටසෙහි අඩංගු විය යුතු ය;

(ඊ) ශ්‍රව්‍යවේදඥයන් වශයෙන් ලේඛනයට ඇතුළත් කරනු ලැබූ සියලු තැනැත්තන්ගේ නම් "ඊ" කොටසෙහි අඩංගු විය යුතු ය;

(උ) සායනික භෞතවේදඥයන් වශයෙන් ලේඛනයට ඇතුළත් කරනු ලැබූ සියලු තැනැත්තන්ගේ නම් "උ" කොටසෙහි අඩංගු විය යුතු ය;

(ඌ) භාෂණ චිකිත්සකයින් වශයෙන් ලේඛනයට ඇතුළත් කරනු ලැබූ සියලු තැනැත්තන්ගේ නම් "ඌ" කොටසෙහි අඩංගු විය යුතු ය;

(එ) කරපාද චිකිත්සකයන් වශයෙන් ලේඛනයට ඇතුළත් කරනු ලැබූ සියලු තැනැත්තන්ගේ නම් "එ" කොටසෙහි අඩංගු විය යුතු ය;

(ඒ) ආහාරඥයන් වශයෙන් ලේඛනයට ඇතුළත් කරනු ලැබූ සියලු තැනැත්තන්ගේ නම් "ඒ" කොටසෙහි අඩංගු විය යුතු ය;

(ඔ) අක්ෂි පරීක්ෂක සහායකයින් වශයෙන් ලේඛනයට ඇතුළත් කරනු ලැබූ සියලු තැනැත්තන්ගේ නම් "ඔ" කොටසෙහි අඩංගු විය යුතු ය;

(ඕ) විද්‍යුත් නිකර්පර් ජේඛකයන් වශයෙන් ලේඛනයට ඇතුළත් කරනු ලැබූ සියලු තැනැත්තන්ගේ නම් "ඕ" කොටසෙහි අඩංගු විය යුතු ය;

(ක) පෝෂණඥයන් වශයෙන් ලේඛනයට ඇතුළත් කරනු ලැබූ සියලු තැනැත්තන්ගේ නම් "ක" කොටසෙහි අඩංගු විය යුතු ය;

(ග) සායනික මනෝවිද්‍යාඥයින් වශයෙන් ලේඛනයට ඇතුළත් කරනු ලැබූ සියලු තැනැත්තන්ගේ නම් "ග" කොටසෙහි අඩංගු විය යුතු ය.

(2) සහාය වෛද්‍ය සහායකයකු වශයෙන් ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් කිරීමේදී ලියාපදිංචි කිරීම සඳහා වූ ගාස්තුව රෙජිස්ට්‍රාර්වරයාට ගෙවිය යුතු අතර, එය රුපියල් දෙසිය පනහක් විය යුතු ය.

සහාය වෛද්‍ය සහායක සින්ගේ ලේඛනයට ඇතුළත් කිරීම සඳහා වූ සුදුසුකම්.

60ආ. (අ) යම් තැනැත්තකු මනා චරිතයකින් යුක්ත වන්නේ නම් සහ විද්‍යාල සභාව විසින් විකිරණ ශිල්පියකු වශයෙන් නිකුත් කරනු ලැබූ ප්‍රවීණතා සහතික පත්‍රයක් දරන්නේ නම්, ඔහු විකිරණ ශිල්පියකු වශයෙන් සහාය වෛද්‍ය සහාය කයන් පිළිබඳ ලේඛනයට ඇතුළත් කරනු ලැබීම සඳහා සුදුසුකම් ලබන්නේ ය.

(ආ) යම් තැනැත්තකු මනා චරිතයකින් යුක්ත වන්නේ නම් සහ විද්‍යාල සභාව විසින් වෛද්‍ය රසායනාගාර කාර්මිකඥයකු වශයෙන් නිකුත් කරනු ලැබූ ප්‍රවීණතා සහතික පත්‍රයක් දරන්නේ නම්, ඔහු වෛද්‍ය රසායනාගාර කාර්මිකඥයකු වශයෙන් සහාය වෛද්‍ය සහකාරයන් පිළිබඳ ලේඛනයට ඇතුළත් කරනු ලැබීම සඳහා සුදුසුකම් ලබන්නේ ය.

(ඇ) යම් තැනැත්තකු මනා චරිතයකින් යුක්ත වන්නේ නම් සහ විද්‍යාල සභාව විසින් භෞත චිකිත්සකයකු වශයෙන් නිකුත් කරනු ලැබූ ප්‍රවීණතා සහතික පත්‍රයක් දරන්නේ නම්, ඔහු භෞතචිකිත්සකයකු වශයෙන් සහාය වෛද්‍ය සහකාරයන් පිළිබඳ ලේඛනයට ඇතුළත් කරනු ලැබීම සඳහා සුදුසුකම් ලබන්නේ ය.

(ඈ) යම් තැනැත්තකු මනා චරිතයකින් යුක්ත වන්නේ නම් සහ විද්‍යාල සභාව විසින් වෘත්තීය චිකිත්සකයකු වශයෙන් නිකුත් කරනු ලැබූ ප්‍රවීණතා සහතික පත්‍රයක් දරන්නේ නම්, ඔහු වෘත්තීය චිකිත්සකයකු වශයෙන් සහාය වෛද්‍ය සහකාරයන් පිළිබඳ ලේඛනයට ඇතුළත් කරනු ලැබීම සඳහා සුදුසුකම් ලබන්නේ ය.

(ඉ) යම් තැනැත්තකු මනා චරිතයකින් යුක්ත වන්නේ නම් සහ විද්‍යාල සභාව විසින් විද්‍යුත් චත්තුරේඛකයකු වශයෙන් නිකුත් කරනු ලැබූ ප්‍රවීණතා සහතික පත්‍රයක් දරන්නේ නම්, ඔහු විද්‍යුත් චත්තුරේඛකයකු වශයෙන් සහාය වෛද්‍ය සහකාරයන් පිළිබඳ ලේඛනයට ඇතුළත් කරනු ලැබීම සඳහා සුදුසුකම් ලබන්නේ ය.

(ඊ) යම් තැනැත්තකු මනා චරිතයකින් යුක්ත වන්නේ නම් සහ විද්‍යාල සභාව විසින් ශ්‍රවණ වේදඥයකු වශයෙන් නිකුත් කරනු ලැබූ ප්‍රවීණතා සහතික පත්‍රයක් දරන්නේ නම්, ඔහු ශ්‍රවණවේදඥයකු ලෙස සහාය වෛද්‍ය සහකාරයන් පිළිබඳ ලේඛනයට ඇතුළත් කරනු ලැබීම සඳහා සුදුසුකම් ලබන්නේ ය.

(ඉ) යම් තැනැත්තකු මනා චරිතයකින් යුක්ත වන්නේ නම් සහ විද්‍යාල සභාව විසින් සායනික භෞතවේදඥයකු වශයෙන් නිකුත් කරනු ලැබූ ප්‍රවීණතා සහතික පත්‍රයක් දරන්නේ නම්, ඔහු සායනික භෞතවේදඥයකු වශයෙන් සහාය වෛද්‍ය සහකාරයන් පිළිබඳ ලේඛනයට ඇතුළත් කරනු ලැබීම සඳහා සුදුසුකම් ලබන්නේ ය.

(ඊ) යම් තැනැත්තකු මනා චරිතයකින් යුක්ත වන්නේ නම් සහ විද්‍යාල සභාව විසින් භාෂණ චිකිත්සකයකු වශයෙන් නිකුත් කරනු ලැබූ ප්‍රවීණතා සහතික පත්‍රයක් දරන්නේ නම්, ඔහු භාෂණ චිකිත්සකයකු වශයෙන් සහාය වෛද්‍ය සහකාරයන් පිළිබඳ ලේඛනයට ඇතුළත් කරනු ලැබීම සඳහා සුදුසුකම් ලබන්නේ ය.

(එ) යම් තැනැත්තකු මනා චරිතයකින් යුක්ත වන්නේ නම් සහ විද්‍යාල සභාව විසින් කරපාද චිකිත්සකයකු වශයෙන් නිකුත් කරනු ලැබූ ප්‍රවීණතා සහතික පත්‍රයක් දරන්නේ නම්, ඔහු කරපාද චිකිත්සකයකු වශයෙන් සහාය වෛද්‍ය සහකාරයන් පිළිබඳ ලේඛනයට ඇතුළත් කරනු ලැබීම සඳහා සුදුසුකම් ලබන්නේ ය.

(ඒ) යම් තැනැත්තකු මනා චරිතයකින් යුක්ත වන්නේ නම් සහ විද්‍යාල සභාව විසින් ආහාරඥයකු වශයෙන් නිකුත් කරනු ලැබූ ප්‍රවීණතා සහතික පත්‍රයක් දරන්නේ නම්, ඔහු ආහාරඥයකු වශයෙන් සහාය වෛද්‍ය සහකාරයන් පිළිබඳ ලේඛනයට ඇතුළත් කරනු ලැබීම සඳහා සුදුසුකම් ලබන්නේ ය.

(ඔ) යම් තැනැත්තකු මනා චරිතයකින් යුක්ත වන්නේ නම් සහ විද්‍යාල සභාව විසින් අක්ෂි පරීක්ෂක සහායකයකු වශයෙන් නිකුත් කරනු ලැබූ ප්‍රවීණතා සහතික පත්‍රයක් දරන්නේ නම්, ඔහු අක්ෂි පරීක්ෂක සහායකයකු වශයෙන් සහාය වෛද්‍ය සහකාරයන් පිළිබඳ ලේඛනයට ඇතුළත් කරනු ලැබීම සඳහා සුදුසුකම් ලබන්නේ ය.

(ඕ) යම් තැනැත්තකු මනා චරිතයකින් යුක්ත වන්නේ නම් සහ විද්‍යාල සභාව විසින් විද්‍යුත් නිකර්පර රේඛකයකු වශයෙන් නිකුත් කරනු ලැබූ ප්‍රවීණතා සහතික පත්‍රයක් දරන්නේ නම්, ඔහු විද්‍යුත් නිකර්පර රේඛකයකු වශයෙන් සහාය වෛද්‍ය සහකාරයන් පිළිබඳ ලේඛනයට ඇතුළත් කරන ලැබීම සඳහා සුදුසුකම් ලබන්නේ ය.

(ක) යම් තැනැත්තකු මනා චරිතයකින් යුක්ත වන්නේ නම් සහ විද්‍යාල සභාව විසින් පෝෂණඥයකු වශයෙන් නිකුත් කරනු ලැබූ ප්‍රවීණතා සහතික පත්‍රයක් දරන්නේ නම්, ඔහු පෝෂණඥයකු වශයෙන් සහාය වෛද්‍ය සහකාරයන් පිළිබඳ ලේඛනයට ඇතුළත් කරනු ලැබීම සඳහා සුදුසුකම් ලබන්නේ ය.

(ග) යම් තැනැත්තකු මනා චරිතයකින් යුක්ත වන්නේ නම් සහ විද්‍යාල සභාව විසින් සායනික මනෝ විද්‍යාඥයකු වශයෙන් නිකුත් කරනු ලැබූ ප්‍රවීණතා සහතික පත්‍රයක් දරන්නේ නම්, ඔහු සායනික මනෝ විද්‍යාඥයකු වශයෙන් සහාය වෛද්‍ය සහකාරයන් පිළිබඳ ලේඛනයට ඇතුළත් කරනු ලැබීම සඳහා සුදුසුකම් ලබන්නේ ය.

සහාය වෛද්‍ය සහකාරයකුගේ නම ලේඛනයෙන් මකා දැමිය හැක්කේ කවර අවස්ථාවල දී ද යන වග.

60ඇ. මේ ආඥාපනත යටතේ සහාය වෛද්‍ය සහකාරයකු වශයෙන් නම ලියාපදිංචි කරනු ලැබූ යම් තැනැත්තකු—

(අ) සහාය වෛද්‍ය සහකාරයකු වශයෙන් ලියාපදිංචි කරනු ලැබුවේ යම් සහතික පත්‍රයක් මත ද, ඒ සහතික පත්‍රය ඔහුට අහිමි කරනු ලැබිණි නම්; හෝ

(ආ) සහාය වෛද්‍ය සහකාරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට නුසුදුසු බව දක්වන ආකාරයේ වරදකට වරදකරු කරනු ලැබිණි නම්; හෝ

(ඇ) සහාය වෛද්‍ය සහකාර වෘත්තියේ යෙදීමට ඔහුට නිර්භයව ඉඩ දිය නොහැකි වන සේ සහාය වෛද්‍ය සහකාරයකු වශයෙන් නොසැලකිල්ලක් හෝ අසමත්කමක් දක්වන්නේ නම්; හෝ

(ඈ) යම් වෘත්තියේ යෙදීමේ දී යම් ආකාරයකින් අපකීර්තිමත් පැවැත්ම සම්බන්ධ වරදක් කර තිබේ නම්

ඔහුගේ නම සහාය වෛද්‍ය සහකාරයන් පිළිබඳ ලේඛනයෙන් මකා දැමිය හැකි ය.

සහාය වෛද්‍ය සහකාරයකු බවට නීති විරෝධී ලෙස ව්‍යාජ නිරූපණය.

60ඈ. (1) ලියාපදිංචි වූ සහාය වෛද්‍ය සහකාරයකු නොවන කිසිම තැනැත්තකු විසින් ලියාපදිංචි වූ සහාය වෛද්‍ය සහකාරයකු වශයෙන් තමා මේ ආඥාපනත යටතේ ලියාපදිංචි වී ඇති බව අඟවන යම් නමක්, අභිධානයක් හෝ විස්තරයක් භාවිත නොකළ යුතු ය.

(2) සහාය වෛද්‍ය සහකාරයන් පිළිබඳ ලේඛනයේ යම් කොටසක තම නම ඇතුළත් කරනු ලැබූ කිසිම තැනැත්තකු විසින්, ඇත්ත වශයෙන් ම, ඒ තැනැත්තාගේ නම ඒ ලේඛනයේ වෙනත් යම් කොටසක ඇතුළත් කර නොමැති වුව ද එසේ ඇතුළත් කර ඇති බව අඟවන යම් නමක්, අභිධානයක් හෝ විස්තරයක් භාවිත කිරීම හෝ වෙනත් යම් ක්‍රියාවක් කිරීම හෝ නොකළ යුතු ය.

සුදුසුකම් නොලත් තැනැත්තකු සහාය වෛද්‍ය සහකාරයකු වශයෙන් වෘත්තියේ යෙදීම තහනම් කිරීම.

60ඉ. ලියාපදිංචි වූ සහාය වෛද්‍ය සහකාරයකු නොවන කිසිම තැනැත්තකු විසින් සහාය වෛද්‍ය සහකාරයකු වශයෙන් ලාභ පිණිස වෘත්තියේ යෙදීම හෝ වෘත්තියේ යෙදෙන බව ප්‍රසිද්ධියේ කියා පෑම හෝ වෘත්තියේ යෙදෙන බවට තම නම ප්‍රචාරය කිරීම හෝ නොකළ යුතු ය.".

30. ප්‍රධාන ප්‍රඥප්තියේ 62 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඊ) ඡේදය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 62 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(ඊ) ශ්‍රී ලංකාවෙන් පිටදී හෙදියන් වශයෙන් සුදුසුකම් ලැබීමෙන් පසුව, කාර්යක්ෂම ලෙස හෙදි වෘත්තියේ යෙදීමට තමන්ට හැකිවෙන පරිදි ප්‍රමාණවත් දැනුම හා නිපුණත්වය තමන් සතු බවට වෛද්‍ය සභාව සෑහීමට පත් කරන සියලුම තැනැත්තන්ගේ නම් "ඊ" කොටසෙහි අඩංගු විය යුතු ය;".

31. ප්‍රධාන ප්‍රඥප්තියේ 63 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

ප්‍රධාන ප්‍රඥප්තියේ 63 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(1) සාමාන්‍ය හෙදියක වශයෙන් ලේඛනයට ඇතුළත් කරගනු ලැබීමේ කොන්දේසි වූ කලී, විද්‍යාල සභාව විසින් හෝ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා විසින් නිකුත් කරන ලද හෙදියක වශයෙන් දැක් වූ කාර්යක්ෂමතාව පිළිබඳ සහතික පත්‍රයක් අයදුම්කරු විසින් දැරීම වන්නේ ය."; තව ද,

(2) මේ වගන්තියේ (3) වන උපවගන්තියේ (ආ) ඡේදයේ "ලංකා වෛද්‍ය සභාව" යන වචන වෙනුවට "වෛද්‍ය මණ්ඩලය" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 64 වන වගන්තිය සංශෝධනය කිරීම.

32. ප්‍රධාන ප්‍රඥප්තියේ 64 වන වගන්තියේ (අ) ඡේදය අත් හැරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 67අ වන වගන්තිය සංශෝධනය කිරීම.

33. ප්‍රධාන ප්‍රඥප්තියේ 67අ වන වගන්තිය මෙයින් ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"මේ ආඥාපනතේ ඉහත විධිවිධාන යටතේ සුදුසුකම් නොලත් ඇතැම් තැනැත්තන් වෛද්‍යවෘත්තිකයන්, දන්ත වෛද්‍යවරයන් හෝ හෙදියන් වශයෙන් ලියාපදිංචි කිරීම.

67අ. මේ ආඥාපනතේ වෙනත් යම් විධිවිධානයක කුමක් සඳහන් වී තිබුණ ද, ශ්‍රී ලංකාවේ තාවකාලික ලෙස වාසය කරන සහ වෛද්‍ය වෘත්තිකයකු, දන්ත වෛද්‍යවරයකු හෝ හෙදියක වශයෙන් මේ ආඥාපනතේ පෙරාතුව වූ විධිවිධාන යටතේ ලියාපදිංචි කරනු ලැබීමට සුදුසුකම් නොමැති යම් තැනැත්තකු—

(අ) වෛද්‍ය වෘත්තිකයකු, දන්ත වෛද්‍යවරයකු හෝ හෙදියක වශයෙන් කාර්යක්ෂම ලෙස වෘත්තියේ යෙදීම සඳහා ප්‍රමාණවත් වූ දැනුම හා නිපුණත්වය සතුව තිබේ නම්; සහ

(ආ) වෛද්‍ය වෘත්තිකයකු, දන්ත වෛද්‍යවරයකු හෝ හෙදියක වශයෙන් වෘත්තියේ යෙදීමේ කාර්යය සඳහා ආණ්ඩුවේ හෝ ලංකා විශ්වවිද්‍යාලයේ හෝ අනුරූපී විශ්වවිද්‍යාලයක ආරාධනය මත ශ්‍රී ලංකාවේ සිටින්නේ නම්

ඔහු ශ්‍රී ලංකාවේ තාවකාලිකව වාසය කරන කාලසීමාව තුළ වෛද්‍ය වෘත්තිකයකු, දන්ත වෛද්‍යවරයකු හෝ හෙදියක වශයෙන් ලියාපදිංචි කරනු ලැබීම පිණිස ඔහු විසින් වෛද්‍ය සභාව වෙත ලියවිල්ලකින් ඉල්ලුම් කළ හැකි අතර, මේ වගන්තියේ පෙරාතුව වූ විධිවිධාන යටතේ ඉල්ලුම් කිරීමට ඉල්ලුම්කරුට සුදුසුකම් තිබෙන බවට වෛද්‍ය සභාව සෑහීමට පත් වුවහොත් වෛද්‍ය සභාව විසින් ඒ ඉල්ලීමට ඉඩ දිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 68 වන වගන්තිය සංශෝධනය කිරීම.

34. ප්‍රධාන ප්‍රඥප්තියේ 68 වන වගන්තියේ, "රුපියල් දෙසිය කට නොවැඩි" යන වචන වෙනුවට "රුපියල් පන්දහසක් නොඉක්මවන" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

35. ප්‍රධාන ප්‍රඥප්තියේ 72 වන වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 72 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(3) 19 වන වගන්තියේ හෝ 55 වන වගන්තියේ සඳහන් වන යම් කාර්යයක් සඳහා යම් නියෝගයක් සෑදීමට පෙර, අමාත්‍යවරයා විසින් වෛද්‍ය සභාව විමසිය යුතු ය. මේ ආඥාපනත යටතේ ලියාපදිංචි වීම සඳහා යම් නෑනැත්තකු හිමිකම් ලබා දෙන යම් සුදුසුකමක් ප්‍රදානය කරන හෝ පිරිනමන සෑම විශ්වවිද්‍යාලයකම හෝ ආයතනයකම අදහස් ලබා ගැනීම සඳහා 19(ඉ) හා (ඊ) වන වගන්ති යටතේ වූ නියෝග කෙටුම්පත් ඒ විශ්වවිද්‍යාලයට හෝ ආයතනයට යැවිය යුතු අතර, ඒ විශ්වවිද්‍යාලය හෝ ආයතනය විසින් දක්වනු ලැබ, ඒ විශ්වවිද්‍යාලයට හෝ ආයතනයට ඒ නියෝග කෙටුම්පත් ලැබුන දින සිට ආගණනය කරනු ලබන මාස තුනක කාලයක් ඇතුළත තමා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අදහස් අමාත්‍යවරයා විසින් සැලකිල්ලට ගත යුතු ය.".

36. ප්‍රධාන ප්‍රඥප්තියේ 73 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 73 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (අ) ඡේදයේ "මේ ආඥාපනතේ IV වන, V වන, VI වන, VII වන VIII වන හා IX වන කොටස්" යන වචන හා සංඛ්‍යා වෙනුවට "මේ ආඥාපනතේ IV වන, V වන, VI වන, VII වන, VIII වන, VIIIඅ වන හා IX වන කොටස්" යන වචන හා සංඛ්‍යා ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තියේ (ආ) ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ආ) මේ ආඥාපනතේ කාර්ය සඳහා පාර්ලිමේන්තුව විසින් වාර්ෂිකව ඒකාබද්ධ අරමුදලෙන් වෙන් කරනු ලබන මුදල් ද.".

37. ප්‍රධාන ප්‍රඥප්තියේ 74 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 74 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) "දන්ත වෛද්‍යවරයා" යන අර්ථකථනයට පෙරාතුවම, පහත දැක්වෙන අර්ථකථනය ඇතුළත් කිරීමෙන් :—

"අනුරූපී විශ්වවිද්‍යාලය" යන යෙදුම ලංකා විශ්වවිද්‍යාලයට අදාළ වන විට, ඉන්—

(අ) 1966 අංක 20 දරන උසස් අධ්‍යාපන පනත මගින් පිහිටුවනු ලැබූ හෝ පිහිටුවා ඇති ලෙස සලකනු ලබන විශ්වවිද්‍යාලයක් අදහස් වේ ;

(ආ) 1972 අංක 1 දරන ලංකා විශ්වවිද්‍යාල පනත මගින් පිහිටුවනු ලැබූ ලංකා විශ්ව විද්‍යාලය අදහස් වේ ; නැතහොත්

(ඇ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත මගින් පිහිටුවනු ලැබූ හෝ පිහිටුවා ඇති ලෙස සලකනු ලබන විශ්වවිද්‍යාලයක් අදහස් වේ ;

(2) "දන්ත වෛද්‍ය පනත්", "වෛද්‍ය පනත්" සහ "වින්නඹු පනත්" පිළිබඳව පිළිවෙලින් ඇති අර්ථකථන අත් හැරීමෙන් ;

(3) "රෙජිස්ට්‍රාර්වරයා" පිළිබඳ අර්ථකථනය වෙනුවට පහත දැක්වෙන අර්ථකථනය ආදේශ කිරීමෙන් :—

"රෙජිස්ට්‍රාර්වරයා" යන්නෙන් වෛද්‍ය සභාවේ රෙජිස්ට්‍රාර්වරයා අදහස් වන අතර, වැඩබලන රෙජිස්ට්‍රාර් වරයා ද ඊට ඇතුළත් වේ ;

(4) "නියෝගය" පිළිබඳ අර්ථකථනයට ඉක්බිතිව ම පහත දැක් වෙන අර්ථකථනය ඇතුළත් කිරීමෙන් :—

"ලංකා විශ්වවිද්‍යාලය" යන්නෙන් ලංකා විශ්ව විද්‍යාලය ආඥාපනත මගින් පිහිටුවනු ලැබූ ලංකා විශ්ව විද්‍යාලය අදහස් වේ.".

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා යන සඳහනට ශික්ෂණ රෝහල් අධ්‍යක්ෂ ජනරාල් වරයා ඇතුළත් වන බව.

38. ප්‍රධාන ප්‍රඥප්තියේ 20 (2) (ආ) (iii), (ආආ) (ii) වන, 31 වන, 51 (1) (ආ) වන හා 63 වන වගන්තිවල සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා ගැන කෙරෙන සෑම සඳහන් කිරීමකම ශික්ෂණ රෝහල් අධ්‍යක්ෂ ජනරාල්වරයා පිළිබඳ සඳහන් කිරීමක් ද ඇතුළත් වන ලෙස සැලකිය යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 74 අ අළුත් වගන්තිය ඇතුළත් කිරීම.

39. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 74 වගන්තියට ඉක්බිතිව ම, 74අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු පහත දැක්වෙන අළුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලැබේ :—

"ඇපොතිකරි සහකාර වෛද්‍ය වෘත්තික ලෙස හඳුන්වනු ලැබිය යුතු බව.

74අ. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, ප්‍රධාන ප්‍රඥප්තියෙහි සහ වෙනත් යම් ලිඛිත නීතියක ඇපොතිකරි සම්බන්ධයෙන් වූ සෑම සඳහන් කිරීමක් ම, "සහකාර වෛද්‍ය වෘත්තික" සම්බන්ධයෙන් වූ සඳහන් කිරීමක් ලෙස සලකනු ලැබිය යුතු ය".

ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය සංශෝධනය කිරීම.

40. ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනයේ—

(අ) "ඉල්ලුම්කරු වෛද්‍ය පනත් යටතේ ලියාපදිංචි කරනු ලැබ සිටින අවස්ථාවක" යන ශීර්ෂය යටතේ වූ ප්‍රකාශය ; සහ

(ආ) "ඉල්ලුම්කරු වෛද්‍ය පනත් යටතේ ලියාපදිංචි කරනු ලැබීමට සුදුසුකම් ලබා සිටින අවස්ථාවක" යන ශීර්ෂය යටතේ වූ ප්‍රකාශය

අත් හැරීමෙන් ඒ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**41.** ප්‍රධාන ප්‍රඥප්තියේ තුන්වන උපලේඛනයේ,—

(අ) "ඉල්ලුම්කරු දන්ත වෛද්‍ය පනත් යටතේ ලියාපදිංචි කරනු ලැබ සිටින අවස්ථාවක" යන ශීර්ෂය යටතේ වූ ප්‍රකාශය ; සහ

(ආ) "අයදුම්කරු දන්ත වෛද්‍ය පනත් යටතේ ලියාපදිංචි කරනු ලැබීමට සුදුසුකම් ලබා සිටින අවස්ථාවක" යන ශීර්ෂය යටතේ වූ ප්‍රකාශය

අත් හැරීමෙන් ඒ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ තුන්වන උපලේඛනය සංශෝධනය කිරීම.

**42.** ප්‍රධාන ප්‍රඥප්තියේ හතරවන උපලේඛනයේ,—

(අ) "ඉල්ලුම්කාරිය, වින්නඹු පනත් යටතේ සහතික කරනු ලැබ සිටින අවස්ථාවක" යන ශීර්ෂය යටතේ වූ ප්‍රකාශය ; සහ

(ආ) "ඉල්ලුම්කාරිය, වින්නඹු පනත් යටතේ සහතික කරනු ලැබීමට සුදුසුකම් ලබා සිටින අවස්ථාවක" යන ශීර්ෂය යටතේ වූ ප්‍රකාශය

අත් හැරීමෙන් ඒ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ හතරවන උපලේඛනය සංශෝධනය කිරීම.

**43.** ප්‍රධාන ප්‍රඥප්තියේ පස්වන උපලේඛනයේ අගට පහත දැක්වෙන කොටස එකතු කිරීමෙන් ඒ ප්‍රඥප්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ පස්වන උපලේඛනය සංශෝධනය කිරීම.

"සහාය වෛද්‍ය සහකාරයකු වශයෙන් ලියාපදිංචි කිරීම සඳහා වූ ප්‍රකාශ

විද්‍යාල සභාව විසින් නිකුත් කරනු ලබන විකිරණ ශිල්පියකු වශයෙන් වූ ප්‍රවීණතා සහතික පත්‍රයක් ඉල්ලුම්කරු දරන අවස්ථාවක—

(ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය) වන මම මෙයින් මෙසේ ප්‍රකාශ කරමි :—

විද්‍යාල සභාව විසින් නිකුත් කරනු ලැබ, දැනට ඉදිරිපත් කොට මට පෙන්වනු ලැබූ සහ "අ" සලකුණු කරනු ලැබ ඇති, විකිරණ ශිල්පියකු වශයෙන් වූ ප්‍රවීණතා සහතික පත්‍රයේ (නම) යනුවෙන් නම් කරන ලද තැනැත්තා මම වෙමි.

(ඉල්ලුම්කරුගේ අත්සන)

වර්ෂ ක් වූ මස මෙම දින දී ය.

වර්ෂ ක් වූ මස මෙම දින මා ඉදිරිපිට දී ප්‍රකාශ කරන ලදී.

සාමදාන විනිශ්චයකරු හෝ
දිවුරුම් කොමසාරිස්.

(ප්‍රකාශය ගන්නා තැනැත්තාගේ අත්සන)

විද්‍යාල සභාව විසින් නිකුත් කරනු ලැබූ වෛද්‍ය රසායනාගාර කාර්මිකඥයකු වශයෙන් වූ ප්‍රවීණතා සහතික පත්‍රයක් ඉල්ලුම්කරු දරන අවස්ථාවක

(ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය) වන මම මෙයින් මෙසේ ප්‍රකාශ කරමි :—

විද්‍යාල සභාව විසින් නිකුත් කරනු ලැබ, දැනට ඉදිරිපත් කොට මට පෙන්වනු ලැබූ සහ "අ" සලකුණු කරනු ලැබ ඇති, වෛද්‍ය රසායනාගාර කාර්මිකඥයකු වශයෙන් වූ ප්‍රවීණතා සහතික පත්‍රයේ (නම) යනුවෙන් නම් කරන ලද තැනැත්තා මම වෙමි.

(ඉල්ලුම්කරුගේ අත්සන)

වර්ෂ ක් වූ මස මෙම දින දී ය.

වර්ෂ ක් වූ මස මෙම දින මා ඉදිරිපිට දී ප්‍රකාශ කරන ලදී.

සාමදාන විනිශ්චයකරු හෝ
දිවුරුම් කොමසාරිස්.

(ප්‍රකාශය ගන්නා තැනැත්තාගේ අත්සන)

**විද්‍යාල සභාව විසින් නිකුත් කරනු ලැබූ භෞත චිකිත්සකයකු වශයෙන් වූ ප්‍රවීණතා සහතික පත්‍රයක ඉල්ලුම්කරු දරන අවස්ථාවක**

(ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය) වන මම මෙයින් මෙසේ ප්‍රකාශ කරමි :—

විද්‍යාල සභාව විසින් නිකුත් කරනු ලැබ, දැනට ඉදිරිපත් කොට මට පෙන්වනු ලැබූ සහ "අ" සලකුණු කරනු ලැබ ඇති, භෞත චිකිත්සකයකු වශයෙන් වූ ප්‍රවීණතා සහතික පත්‍රයේ (නම) යනුවෙන් නම් කරන ලද තැනැත්තා මම වෙමි.

(ඉල්ලුම්කරුගේ අත්සන)

වර්ෂ ක් වූ මස මෙම දින දී ය.

වර්ෂ ක් වූ මස මෙම දින මා ඉදිරිපිට දී ප්‍රකාශ කරන ලදී.

සාමදාන විනිශ්චයකරු හෝ
දිවුරුම් කොමසාරිස්

(ප්‍රකාශය ගත් තැනැත්තාගේ අත්සන)

**විද්‍යාල සභාව විසින් නිකුත් කරනු ලැබූ වෘත්තීය චිකිත්සකයකු වශයෙන් වූ ප්‍රවීණතා සහතික පත්‍රය ඉල්ලුම්කරු දරන අවස්ථාවක**

(ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය) වන මම මෙයින් මෙසේ ප්‍රකාශ කරමි :—

විද්‍යාල සභාව විසින් නිකුත් කරනු ලැබ, දැනට ඉදිරිපත් කොට මට පෙන්වනු ලැබූ සහ "අ" සලකුණු කරනු ලැබ ඇති, වෘත්තීය චිකිත්සකයකු වශයෙන් වූ ප්‍රවීණතා සහතික පත්‍රයේ (නම) යනුවෙන් නම් කරන ලද තැනැත්තා මම වෙමි.

(ඉල්ලුම්කරුගේ අත්සන)

වර්ෂ ක් වූ මස මෙම දින දී ය.

වර්ෂ ක් වූ මස මෙම දින මා ඉදිරිපිට දී ප්‍රකාශ කරන ලදී.

සාමදාන විනිශ්චයකරු හෝ
දිවුරුම් කොමසාරිස්.

(ප්‍රකාශය ගත් තැනැත්තාගේ අත්සන)

**විද්‍යාල සභාව විසින් නිකුත් කරනු ලැබූ විද්‍යුත් චන්තුරේඛකයකු වශයෙන් වූ ප්‍රවීණතා සහතික පත්‍රය ඉල්ලුම්කරු දරන අවස්ථාවක**

(ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය) වන මම මෙයින් මෙසේ ප්‍රකාශ කරමි :—

විද්‍යාල සභාව විසින් නිකුත් කරන ලැබ, දැනට ඉදිරිපත් කොට මට පෙන්වනු ලැබූ "අ" සලකුණු කරනු ලැබ ඇති විද්‍යුත් චන්තුරේඛකයකු වශයෙන් වූ ප්‍රවීණතා සහතික පත්‍රයේ (නම) යනුවෙන් නම් කරන ලද තැනැත්තා මම වෙමි.

(ඉල්ලුම්කරුගේ අත්සන)

වර්ෂ ක් වූ මස මෙම දින දී ය.

වර්ෂ ක් වූ මස මෙම දින මා ඉදිරිපිට දී ප්‍රකාශ කරන ලදී.

සාමදාන විනිශ්චයකරු හෝ
දිවුරුම් කොමසාරිස්.

(ප්‍රකාශය ගත් තැනැත්තාගේ අත්සන)

**විද්‍යාල සභාව විසින් නිකුත් කරනු ලැබූ ශ්‍රව්‍යවේදඥයකු වශයෙන් වූ ප්‍රවීණතා සහතික පත්‍රය ඉල්ලුම්කරු දරන අවස්ථාවක**

(ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය) වන මම මෙයින් මෙසේ ප්‍රකාශ කරමි :—

විද්‍යාල සභාව විසින් නිකුත් කරනු ලැබ, දැනට ඉදිරිපත් කොට මට පෙන්වනු ලැබූ සහ "අ" සලකුණු කරනු ලැබ ඇති ශ්‍රව්‍යවේදඥයකු වශයෙන් වූ ප්‍රවීණතා සහතික පත්‍රයේ (නම) යනුවෙන් නම් කරන ලද තැනැත්තා මම වෙමි.

(ඉල්ලුම්කරුගේ අත්සන)

වර්ෂ ක් වූ මස මෙම දින දී ය.

වර්ෂ ක් වූ මස මෙම දින මා ඉදිරිපිට දී ප්‍රකාශ කරන ලදී.

සාමදාන විනිශ්චයකරු හෝ
දිවුරුම් කොමසාරිස්.

(ප්‍රකාශය ගන්නා තැනැත්තාගේ අත්සන)

**විද්‍යාල සභාව විසින් නිකුත් කරනු ලැබූ සායනික මනෝවේදඥයකු වශයෙන් වූ ප්‍රවීණතා සහතික පත්‍රය ඉල්ලුම්කරු දරන අවස්ථාවක**

(ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය) වන මම මෙයින් මෙසේ ප්‍රකාශ කරමි :—

විද්‍යාල සභාව විසින් නිකුත් කරනු ලැබ, දැනට ඉදිරිපත් කොට මට පෙන්වනු ලැබූ සහ "අ" සලකුණු කරනු ලැබ ඇති සායනික මනෝවේදඥයකු වශයෙන් වූ ප්‍රවීණතා සහතික පත්‍රයේ (නම) යනුවෙන් නම් කරන ලද තැනැත්තා මම වෙමි.

(ඉල්ලුම්කරුගේ අත්සන)

වර්ෂ ක් වූ මස මෙම දින දී ය.

වර්ෂ ක් වූ මස මෙම දින මා ඉදිරිපිට දී ප්‍රකාශ කරන ලදී.

සාමදාන විනිශ්චයකරු හෝ
දිවුරුම් කොමසාරිස්.

(ප්‍රකාශය ගන්නා තැනැත්තාගේ අත්සන)

**විද්‍යාල සභාව විසින් නිකුත් කරනු ලැබූ භාෂණ චිකිත්සකයකු වශයෙන් වූ ප්‍රවීණතා සහතික පත්‍රය ඉල්ලුම්කරු දරන අවස්ථාවක**

(ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය) වන මම මෙයින් මෙසේ ප්‍රකාශ කරමි :—

විද්‍යාල සභාව විසින් නිකුත් කරනු ලැබ, දැනට ඉදිරිපත් කොට මට පෙන්වනු ලැබූ සහ "අ" සලකුණු කරනු ලැබ ඇති භාෂණ චිකිත්සකයකු වශයෙන් වූ ප්‍රවීණතා සහතික පත්‍රයේ (නම) යනුවෙන් නම් කරන ලද තැනැත්තා මම වෙමි.

(ඉල්ලුම්කරුගේ අත්සන)

වර්ෂ ක් වූ මස මෙම දින දී ය.

වර්ෂ ක් වූ මස මෙම දින මා ඉදිරිපිට දී ප්‍රකාශ කරන ලදී.

සාමදාන විනිශ්චයකරු හෝ
දිවුරුම් කොමසාරිස්.

(ප්‍රකාශය ගන්නා තැනැත්තාගේ අත්සන)

**විද්‍යාල සභාව විසින් නිකුත් කරනු ලැබූ කරපාද චිකිත්සකයකු වශයෙන් වූ ප්‍රවීණතා සහතික පත්‍රය ඉල්ලුම්කරු දරන අවස්ථාවක**

(ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය) වන මම මෙයින් මෙසේ ප්‍රකාශ කරමි:—

විද්‍යාල සභාව විසින් නිකුත් කරනු ලැබ, දැනට ඉදිරිපත් කොට මට පෙන්වනු ලැබූ සහ "අ" සලකුණු කරනු ලැබ ඇති කරපාද චිකිත්සකයකු වශයෙන් වූ ප්‍රවීණතා සහතික පත්‍රයේ (නම) යනුවෙන් නම් කරන ලද තැනැත්තා මම වෙමි.

(ඉල්ලුම්කරුගේ අත්සන)

වර්ෂ ක් වූ මස මෙම දින දී ය.

වර්ෂ ක් වූ මස මෙම දින මා ඉදිරිපිට දී ප්‍රකාශ කරන ලදී.

සාමදාන විනිශ්චයකරු හෝ
දිවුරුම් කොමසාරිස්.

(ප්‍රකාශය ගත් තැනැත්තාගේ අත්සන)

**විද්‍යාල සභාව විසින් නිකුත් කරනු ලැබූ ආහාරඥයකු වශයෙන් වූ ප්‍රවීණතා සහතික පත්‍රය ඉල්ලුම්කරු දරන අවස්ථාවක**

(ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය) වන මම මෙයින් මෙසේ ප්‍රකාශ කරමි:—

විද්‍යාල සභාව විසින් නිකුත් කර ලැබ දැනට ඉදිරිපත් කොට මට පෙන්වනු ලැබූ සහ "අ" සලකුණු කරනු ලැබ ඇති ආහාරඥයකු වශයෙන් වූ ප්‍රවීණතා සහතික පත්‍රයේ (නම) යනුවෙන් නම් කරන ලද තැනැත්තා මම වෙමි.

(ඉල්ලුම්කරුගේ අත්සන)

වර්ෂ ක් වූ මස මෙමු දින දී ය.

වර්ෂ ක් වූ මස මෙම දින මා ඉදිරිපිට දී ප්‍රකාශ කරන ලදී.

සාමදාන විනිශ්චයකරු හෝ
දිවුරුම් කොමසාරිස්.

(ප්‍රකාශය ගත් තැනැත්තාගේ අත්සන)

**විද්‍යාල සභාව විසින් නිකුත් කරනු ලැබූ අක්ෂි පරීක්ෂක සහායකයකු වශයෙන් වූ ප්‍රවීණතා සහතික පත්‍රය ඉල්ලුම්කරු දරන අවස්ථාවක**

(ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය) වන මම මෙයින් මෙසේ ප්‍රකාශ කරමි:—

විද්‍යාල සභාව විසින් නිකුත් කරනු ලැබ දැනට ඉදිරිපත් කොට මට පෙන්වනු ලැබූ සහ "අ" සලකුණු කරනු ලැබ ඇති අක්ෂි පරීක්ෂක සහායකයකු වශයෙන් වූ ප්‍රවීණතා සහතික පත්‍රයේ (නම) යනුවෙන් නම් කරන ලද තැනැත්තා මම වෙමි.

(ඉල්ලුම්කරුගේ අත්සන)

වර්ෂ ක් වූ මස මෙම දින දී ය.

වර්ෂ ක් වූ මස මෙම දින මා ඉදිරිපිට දී ප්‍රකාශ කරන ලදී.

සාමදාන විනිශ්චයකරු හෝ
දිවුරුම් කොමසාරිස්.

(ප්‍රකාශය ගත් තැනැත්තාගේ අත්සන)

**විද්‍යාල සභාව විසින් නිකුත් කරනු ලැබූ විද්‍යුත් නිකර්පර රේඛකයකු වශයෙන් වූ ප්‍රවීණතා සහතික පත්‍රය ඉල්ලුම්කරු දරන අවස්ථාවක**

**(ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය) වන මම මෙයින් මෙසේ ප්‍රකාශ කරමි:—**

විද්‍යාල සභාව විසින් නිකුත් කරනු ලැබ දැනට ඉදිරිපත් කොට මට පෙන්වනු ලැබූ සහ "අ" සලකුණු කරනු ලැබ ඇති විද්‍යුත් නිකර්පර රේඛකයකු වශයෙන් වූ ප්‍රවීණතා සහතික පත්‍රයේ (නම) යනුවෙන් නම් කරන ලද තැනැත්තා මම වෙමි.

(ඉල්ලුම්කරුගේ අත්සන)

වර්ෂ ක් වූ මස මෙම දින දී ය.

වර්ෂ ක් වූ මස මෙම දින මා ඉදිරිපිට දී ප්‍රකාශය කරන ලදී.

සාමදාන විනිශ්චයකරු හෝ
දිවුරුම් කොමසාරිස්.

(ප්‍රකාශය ගන්නා තැනැත්තාගේ අත්සන)

**විද්‍යාල සභාව විසින් නිකුත් කරනු ලැබූ පෝෂණඥයකු වශයෙන් වූ ප්‍රවීණතා සහතික පත්‍රය ඉල්ලුම්කරු දරන අවස්ථාවක**

**(ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය) වන මම මෙයින් මෙසේ ප්‍රකාශ කරමි:—**

විද්‍යාල සභාව විසින් නිකුත් කරනු ලැබ දැනට ඉදිරිපත් කොට මට පෙන්වනු ලැබූ සහ "අ" සලකුණු කරනු ලැබ ඇති විද්‍යුත් නිකර්පර රේඛකයකු වශයෙන් ප්‍රවීණතා සහතික පත්‍රයේ (නම) යනුවෙන් නම් කරන ලද තැනැත්තා මම වෙමි.

(ඉල්ලුම්කරුගේ අත්සන)

වර්ෂ ක් වූ මස මෙම දින දී ය.

වර්ෂ ක් වූ මස මෙම දින මා ඉදිරිපිට දී ප්‍රකාශය කරන ලදී.

**සාමදාන විනිශ්චයකරු හෝ**
දිවුරුම් කොමසාරිස්.

(ප්‍රකාශය ගන්නා තැනැත්තාගේ අත්සන)

**විද්‍යාල සභාව විසින් නිකුත් කරනු ලැබූ සායනික මනෝවිද්‍යාඥයකු වශයෙන් වූ ප්‍රවීණතා සහතික පත්‍රය ඉල්ලුම්කරු දරන අවස්ථාවක**

**(ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය) වන මම මෙයින් මෙසේ ප්‍රකාශ කරමි:—**

විද්‍යාල සභාව විසින් නිකුත් කරනු ලැබ දැනට ඉදිරිපත් කොට මට පෙන්වනු ලැබූ සහ "අ" සලකුණු කරනු ලැබ ඇති සායනික මනෝවිද්‍යාඥයකු වශයෙන් වූ ප්‍රවීණතා සහතික පත්‍රයේ (නම) යනුවෙන් නම් කරන ලද තැනැත්තා මම වෙමි.

(ඉල්ලුම්කරුගේ අත්සන)

වර්ෂ ක් වූ මස මෙම දින දී ය.

වර්ෂ ක් වූ මස මෙම දින මා ඉදිරිපිට දී ප්‍රකාශය කරන ලදී.

**සාමදාන විනිශ්චයකරු හෝ**
දිවුරුම් කොමසාරිස්.

(ප්‍රකාශය ගන්නා තැනැත්තාගේ අත්සන)

**44.** ප්‍රධාන ප්‍රඥප්තියේ යම් විධිවිධානයක කවර වූ හෝ තැනක "සෞඛ්‍ය සේවා අයයක්ෂවරයා" යන වචන යෙදෙන විට ඒ වෙනුවට. "සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා" යන වචන ආදේශ කරනු ලබන අතර, "නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා" යන වචන යෙදෙන විට ඒ වෙනුවට "නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා" යන වචන ආදේශ කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ විධිවිධාන පොදු වශයෙන් සංශෝධනය කිරීම.

**45.** (ප්‍රධාන ප්‍රඥප්තිය නොවන) වෙනත් යම් ලිඛිත නීතියක යම් විධිවිධානයක හෝ එවැනි ලිඛිත නීතියක් මගින් හෝ යටතේ නිකුත් කරන ලද, සාදන ලද, නියම කරන ලද යම් දැන්වීමක, සහතික පත්‍රයක, නිවේදනයක යම් විධිවිධානයක ආකෘතියක හෝ වෙනත් ලේඛනයක, මේ පනත ආරම්භ කිරීමට පෙර ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ පත් කරනු ලැබූ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා ඇඟවීම පිණිස "සෞඛ්‍ය සෙවා අධ්‍යක්ෂවරයා" යන වචන යොදා ඇති ස්ථානවල, ඒ වෙනුවට "සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා" යන වචන ආදේශ කළ යුතු ය.

වෙනත් ලිඛිත නීති සංශෝධනය කිරීම.

**46.** ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ පත් කරනු ලැබූ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා වශයෙන් ඔහු විසින් හෝ ඔහුගේ නමින්, මේ පනත ක්‍රියාත්මක කිරීම ආරම්භ කිරීමට පෙර සාදන ලද, නිකුත් කරන ලද හෝ ලියා අත්සන් කරන ලද සෑම ගිවිසුමක්ම, එකඟත්වයකට හෝ වෙනත් ලේඛනයකට හෝ කවර හෝ සාධන පත්‍රයකට, එදින හා එදිනට පසුව, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හෝ ඔහුගේ නමින් සාදනු ලැබූ ලෙස හා සාදනු ලැබිය යුතු ලෙස ද, නිකුත් කරනු ලැබූ ලෙස හා ලැබිය යුතු ලෙස ද ලියා අත්සන් කරනු ලැබූ ලෙස හා ලැබිය යුතු ලෙස ද සලකනු ලැබිය යුතු ය.

ගිවිසුම් ආරක්ෂා කිරීම.